# ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.

## VII සභා වාරය පනස් වන මාසික සභා රැස්වීම් වාර්තාව.

ස්ථානය : ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.
දිනය : 2022.04.08.
වේලාව: පෙ.ව. 10.00.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ ගරු සභාපති එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදි.

මෙදින සහභාගීත්වය:

01. ගරු සභාපති - එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා.
02. ගරු උප සභාපති - එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා.
04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමා.
05.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ. ආර් ජයානන්ද මැතිතුමා.
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා.
07.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා.
08.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා.
09.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමා.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - දෙවටගේ ධර්මදාස මැතිතුමා.
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා.
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය.
18 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා.
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා.
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය.
21.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, - ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය.
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය.
23. ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා..
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා.

මෙදින සහභාගී නොවූ මන්ත්‍රීවරුන්:

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා.

නිලධාරි සහභාගීත්වය:

01. ලේකම් - ඩී.ඒ.සී.ආර්. දසනායක මිය.
02. සංවර්ධන නිලධාරි - ටී.ටී. රුවන්දිකා මිය.
03. සංවර්ධන නිලධාරි - ශකිලා දිනිති මිය.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ VII සභා වාරයේ පනස් වන සභාව සඳහා පැමිණි ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරි මහත්ම මහත්මීනුත් සහ මාධ්‍යවේදී මහත්ම මහත්මීන් ඇතුළු සියලු දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව, ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදි. පෙ.ව. 10.00 ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

(01). පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් 2022.03.16. වන දින පැවැති මහ සභාවේ සභා වාර්තාව සභාගත කරමින් එම වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් 2022.03.16. වන දින පැවැති සභාවේ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.
පිටු අංක 10, යථා පරිදි කල් දී ඇති යෝජනා තීරණ අංක (05) (xv) හි “ගරු මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් සඳහා සිංහල අලුත් අවුරුදු උත්සවය නිමිත්තෙන් උත්සව අත්තිකාරම් මුදලක් ලබා දෙන ලෙසට යෝජනාවක් ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ කරමින් එම යෝජනාව ඉදිරිපත් කරනවා.
උත්සව අත්තිකාරම් වශයෙන් රු. 50000.00 ක ණය මුදලක් ගෙවීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
සභා අරමුදල් ප්‍රමාණය සලකා බලා රු.25000.00 ක මුදලක් ලබා දීමත් එම මුදල මාසික වාරික 03 කින් කපා හැරීමත්, ඊට අදාල පොළිය අය කර ගැනීමටත් කටයුතු කලයුතු බවට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.
ඒ අනුව රු.25000.00 ක ණය මුදලක් ලබා දීමත් එම ණය මුදල මාසික වාරික 03 කින් කපා හැරීමත්, ඊට අදාල පොළිය අය කර ගැනිමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.”

යන සඳහන

“ගරු මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් සඳහා සිංහල අලුත් අවුරුදු උත්සවය නිමිත්තෙන් උත්සව අත්තිකාරම් වශයෙන් ණය මුදලක් ලබා දෙන ලෙසට මන්ත්‍රී මණ්ඩලය විසින් යෝජනාවක් ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ කරමින් සභා කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා ද උත්සව අත්තිකාරම් වශයෙන් රු. 10 000.00 ක ණය මුදලක් ලබා දීමට අදාල යෝජනා ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

උත්සව අත්තිකාරම් වශයෙන් රු. 50000.00 ක ණය මුදලක් ගෙවීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

ගරු මන්ත්‍රීවරුන්, ගරු මන්ත්‍රීවරියන් සඳහා සභා අරමුදල් ප්‍රමාණය සලකා බලා රු. 25000.00 ක ණය මුදලක් ලබා දීමටත්, එම ණය මුදල මාසික වාරික 03 කින් ඊට අදාල පොළී අනුපාතයත් සමඟ නැවත අයකරගැනීමටත්, සභා කාර්යාලයේ නිලධාරින් සඳහා රු.10 000.00 ක ණය මුදලක් ලබා දීමටත් එම ණය මුදල් නියමිත පොළී අනුපාතයත් සමඟ නැවත අය කර ගැනීමට කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව ගරු මන්ත්‍රීවරුන්, ගරු මන්ත්‍රීවරියන් සඳහා උත්සව අත්තිකාරම් වශයෙන් රු. 25 000.00 ක ණය මුදලක් ලබා දීමටත් එම මුදල මාසික වාරික 03 ක් තුල ඊට අදාල පොළිය සමඟ නැවත අය කර ගැනිමේ

සහ සභා කාර්යාලයේ නිලධාරින් සඳහා රු. 10 000.00 ක ණය මුදලක් ලබා දීමටත් එම ණය මුදල් නියමිත පොළී අනුපාතයත් සමඟ නැවත අය කර ගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.'' යන ලෙසට සංශෝධනය විය යුතු බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

පිටු අංක 04 හි යථා පරිදි කල් දී ඇති යෝජනා තීරණ අංක (05) (i) හි ''පොදු සුසාන භූමිය අසල සිට බෝධිය අසල දක්වා ඉඩම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තරුණ සේවා සහා ගොඩනැගිල්ල පිහිටි හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පිහිටි භූමිය, සමෘද්ධි බැංකුව අසල පිහිටි මිය වශයෙන් එම ස්ථානයේ ඉඩම් කොටස් 03 ක් තිබෙනවා. එම ඉඩම් කොටස් ප්‍රාදේශීය සභාවට ආදායමක් උපයාගත හැකි ආකාරයටත්, අනවසර පදිංචිකරුවන්ට සහනයක් සැලසෙන ආකාරයටත් පවරා ගැනිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදි. ''
යන සඳහන

''පොදු සුසාන භූමිය අසල සිට බෝධිය අසල දක්වා ඉඩම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තරුණ සේවා සහා ගොඩනැගිල්ල පිහිටි හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පිහිටි භූමිය, සමෘද්ධි බැංකුව අසල පිහිටි භූමිය වශයෙන් එම ස්ථානයේ ඉඩම් කොටස් 03 ක් තිබෙනවා. එම ඉඩම් කොටස් ප්‍රාදේශීය සභාවට ආදායමක් උපයාගත හැකි ආකාරයටත්, අනවසර පදිංචිකරුවන්ට සහනයක් සැලසෙන ආකාරයටත් පවරා ගැනිමත්, සභා බල ප්‍රදේශය තුල පිහිටි සභාවට අයත් අනෙකුත් ඉඩම් පිළිබඳව ද සොයා බලා එම ඉඩම් සභාවට පවරාගෙන ජනතා අවශ්‍යතා සඳහා සංවර්ධනය කිරීමට පියවර ගන්නා ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදි. '' යන ලෙසට සංශෝධනය විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්. ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව 2022.03.16. වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ සභා වාර්තාව සංශෝධන සහිතව ඒකමතිකව සභා සම්මත විය.

## (02). ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,

(i). සභා කාර්යාලයේ සේවයේ නියුතු චන්දන රත්නකීර්ති මහතාගේ ආදරණීය භාර්යාව අභාවප්‍රාප්ත වී ඇති බැවින් ඇයගේ අභාවය වෙනුවෙන් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් මගේත් ගරු උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයේත් ශෝකය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා අතර ඒ බව පවුලේ සියලු දෙනා වෙත දන්වා යවන ලෙසට ලේකම් තුමියට උපදෙස් ලබා දෙනවා.

## (03). මාසික මහ සභාවට ලැබී ඇති ලිපි පෙත්සම් සංදේශ හා සන්නිවේදන ඉදිරිපත් කිරීම.

(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් අමුපිටිය සිට උඩවෙල හරහා මොරහැල දක්වා දිවෙන මාර්ගය කාපට් කිරීමේ කටයුතු මේවන විට සිදුවෙමින් පවතින බවත්, එහිදී අමුපිටිය සිට තැන්න දක්වා දිවෙන මාර්ගයේ දෙපස නියමිත පළලින් යුතුව ඉදිකිරීමේ කටයුතු සඳහා අවහිරතාවයන් පවතින බව දක්නට ලැබෙන බැවින් නියමිත පළලින් යුක්තව සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය අදහස් දක්වමින්,
අමුපිටිය සිට තැන්න දක්වා මාර්ගයට ලබා දිය යුතු නිසි පළල තම ඉඩම් වලින් ඉඩම්හිමියන් විසින් ලබා දී ඇතත් එම මාර්ගයේ මීටර් සියයක පමණ දුරක් නිසි පළලින් යුතුව සංවර්ධනය වන්නේ නැහැ. එම නිසා මෙම මාර්ගය නිසි පළලින් යුක්තව සංවර්ධනය කිරීම සඳහා අදාල ආයතන කඩිනමින් දැනුවත් කිරීමට පියවර ගන්න.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
මෙම මාර්ගය බල ප්‍රදේශය තුල පිහිටි ඉතා අත්‍යාවශ්‍ය මාර්ගයක් බැවින් නිසි පළලින් යුතුව මාර්ගය සංවර්ධනය විය යුතු ය. ඒ බව පළාත් මාර්ග අමාත්‍යාංශ ලේකම් වෙතත්, මාර්ගය සංවර්ධනය කරනු ලබන කොන්ත්‍රාත්කාර සමාගම වෙතත් කඩිනමින් දන්වා යැවීමට කටයුතු කරනවා.

(ii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල රාජ්‍ය ඔසු සලක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
දැනට රත්නපුර නගරය තුල රාජ්‍ය ඔසුසලක් ස්ථාපිතව ඇතත් ඉඹුල්පේ කොට්ඨාශයට ඔසුසලක් නැහැ. ජනතාවගේ පහසුව සඳහා ඉඹුල්පේ කොට්ඨාශය තුල හෝ ආසන්න නගරය වන බලංගොඩ නගරය තුල රාජ්‍ය ඔසුසලක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සලසා දෙන්න.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ඉඹුල්පේ කොට්ඨාශය තුල හෝ ආසන්න නගරය වන බලංගොඩ නගරයතුල රාජ්‍ය ඔසුසලක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුව වෙත දන්වා යැවීමට කටයුතු කරනවා.

(iii). 2020 සපිරි ගමක් සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් නොගෙවීම සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් මේ පිළිබඳව අවස්ථා කිහිපයකදී ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව තුලත්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව තුලත් සාකච්ඡා කල බව ප්‍රකාශ කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
මෙම සංවර්ධන කටයුතු නිමාකර වසර දෙකකට ආසන්නයි. මේ සඳහා ලබාදුන් උපදෙස් හා ප්‍රමාණ පත්‍රයට අනුව සංවර්ධනය කටයුතු සිදු කළා. නිලධාරින් දෙදෙනෙක් අධීක්ෂණ කටයුතු සිදු කළා. ඒ බව ප්‍රාදේශීය ලේකම් විසින් දිස්ත්‍රික් ලේකම් වෙත දැනුවත් කළා. මෙම ගැටලුව දිගින් දිගටම උද්ගත වන්න හේතුව වන්නේ අධීක්ෂණ කටයුතු සඳහා පැමිණි අතුල ගම්හේවා මහතා සමඟ තව නිලධාරින් තිදෙනෙක් හැමර් යන්ත්‍රය මාරුවෙන් මාරුවට භාවිතා කිරීමයි. ඔවුන් ඒ බව ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුවේ දී පිළිගත්තා. ඒ බව තහවුරු කිරීම සඳහා වීඩියෝ දර්ශන අපි ළඟ පවතිනවා. තාක්ෂණ සේවා නිලධාරින් මේ පිළිබඳ පුහුණුවක් ලබා තිබුණත් මොවුන්ට තාක්ෂණික පුහුණු සහතික නැහැ. එක් අයෙක් පුහුණුව ලැබුවත් අන් අයට එම යන්ත්‍රය භාවිතා කිරීමට නීත්‍යානුකූල බලයක් නැහැ. ඒ අනුව මෙම මාර්ග සම්බන්ධයෙන් අසත්‍ය මත හා දත්ත ඉදිරිපත් කර ඇති බව තහවුරු වෙනවා. මේ හේතුවෙන් අපගේ ඉල්ලීම පරිදි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව විසින් අවස්ථාව ලබාදුන්නා. ඒ අනුව ලංකාවේ ඉහළම ප්‍රමිති ආයතනයක් වන මාර්ග සංවර්ධන අධිකරියේ රත්නපුර ආයතනයේ සුදුසුකම්ලත් නිලධාරින් විසින් එම මාර්ග පහම පරීක්ෂාවට ලක් කළා. එම මාර්ග ගුණාත්මක තත්ත්වයේ පවතින අතර මාර්ග පහම හැමර් ටෙස්ට්න් සමත් වෙලා. අද මේ සඳහා වග කියන්නේ කවුද? කතා කරන්නේ කවුද? කතා කරන්නේ කා සමඟ ද? මේ පිළිබඳව දිස්ත්‍රික් ලේකම්තුමියගෙන් විමසූ අවස්ථාවේ දී එතුමිය විසින් මුදල් ලේකම්ගෙන් විමසා බලා ලිපියක් නිකුත් කරලා. මේ සඳහා විගණනයක් අවශ්‍යයයි. ඒ බව පිළිබඳව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපතිතුමාට, පළාත් මාර්ග ලේකම්තුමාට, දිස්ත්‍රික් ලේකම්යට සබරගමුව පළාත් ගරු ආණ්ඩකාරතුමාට, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාට මේ අවස්ථාවේ දී සම්පූර්ණ විස්තර ඉදිරිපත් කරනවා. ඒවා අදාල ස්ථාන වෙත කඩිනමින් ඉදිරිපත් කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් විසින් පැහැදිලිවම මාර්ග පහම හිතා මතා අසමත් කර තිබෙනවා. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් මෙම මාර්ග පිළිබඳව ඉතා උසස් ආයතනයකින් පරීක්ෂා කිරීමටත් එම වාර්තාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීමට අවසර ලබා දෙන ලෙසත් අප විසින් ඉල්ලීමක් කලා. ඊට හේතුව මෙම ක්‍රියාදාමය තුල කොට්ඨාසය නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරු ලෙස අපගේ කීර්ති නාමයටත්, මාර්ගය සංවර්ධනය කරන ලද කොන්ත්‍රාත් සමිතියටත්, එම පුද්ගලයන්ටත් අසාධාරණයක් සිදු වෙනවා. ඒ අනුව ලත් අවසරය මත සමිතියේ මුදල් ගෙවීම මත උසස් ආයතනයක් වන මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හැමර් පරීක්ෂණ සිදු කලා. සංවර්ධනය කරනු ලබන මාර්ග වල සම්පීඩ්‍යතා අගය බලන්නේ 20% ක් වුවත් මාර්ග පහ තුලම සම්පීඩ්‍යතා අගය 28 % ට ඉහළින් පවතිනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අක්‍රීය හැමර් යන්ත්‍රයකින් පරීක්ෂා කිරීමේ කටයුතු සිදු කලා. අපි ඒ බව ඔවුන්ට දිගින් දිගටම ප්‍රකාශ කලත් හිතාමතාම මාර්ග වල හැමර් පරීක්ෂණ අසමත් කිරීම සඳහා අක්‍රීය හැමර් යන්ත්‍රයක් භාවිතා කළා. එහි අධීක්ෂණ කටයුතු වලට අප ද සහභාගී වුණා. අතුල ගුණසේකර සැළසුම් අධ්‍යක්ෂතුමාට මාර්ග පරීක්ෂා කිරීමට හැමර් යන්ත්‍රය භාවිතා කිරීමට නීත්‍යානුකූල අයිතියක් නැහැ. එතුමා සැළසුම් අධ්‍යක්ෂවරයායි. කාර්මික නිලධාරි මහතා පරීක්ෂණ කටයුතු සිදු කලයුතුයි. අපි සමඟ තිබුණු පෞද්ගලික අමනාපකමකට එසේ කලා විය හැකියි. මීට පෙර අවස්ථාවකදී වංචා කටයුතු සම්බන්ධයෙන් සොයා බැලීම නිසා නිලධාරින් මාරු කිරීමටත්, නිලධාරි ගෙදර යැවීමටත් කටයුතු සිදු වුණා. ඒ නිසා පොඩි තරහකුත් ඇති. මෙම මාර්ග සම්බන්ධයෙන් පාර්ශවකරුවන් දෙපලක් සිටින අතර තෙවෙනි පාර්ශවය විය යුත්තේ විගණනය වන අතර එමගින් අපක්ෂපාතී පරීක්ෂණයක් ඉල්ලා සිටිනවා. මොරහැල පොල්අතු මාර්ගය ඉතිරි කොටස සංවර්ධනය කිරීම සඳහා ගිවිසුම් ගත වීම 07/06 වෙනිදා භාර දීලා 07/31 වැඩ අවසන් වාර්තාව භාර දීලා. පූර්ණ අධීක්ෂණය කාර්මික නිලධාරි මහතා සංවර්ධන නිලධාරි සහ සැළසුම් අධ්‍යක්ෂකගේ උපදෙස් මත එම මාර්ගයේ හැමර් පරීක්ෂණ 20/11/02 දින සිදු කලා. ඉඹුල්පේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ සැළසුම් අධ්‍යක්ෂ අතුල ගම්හේවා මහතා, අතුල ගුණසේකර මහතා, තාක්ෂණ සේවා නිලධාරි කුමාර මහතා හැමර් පරීක්ෂණ ගැන දැන සිටියේ නැහැ. මාර්ගය පරීක්ෂා කරන අවස්ථාවට අප සහභාගී වුවා. එම අවස්ථාවේ දී ස්වයංක්‍රීයව භාවිතා කල හැකි හැමර් යන්ත්‍රය අක්‍රීයව පවතින බැවින් මැනුවෙල් භාවිතා කරන හැමර් යන්ත්‍රයක් ඒ සඳහා පාවිච්චි කරන බව ප්‍රකාශ කළා. කරුණු කාරණා එසේ තිබියදී හැමර් පරීක්ෂණ අසමත් බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවස්ථා තුනකදී සමිතිය වෙත දන්වා එවා තිබෙනවා. 2020/11/30 දින ඔබ සමිතිය විසින් සිදුකල කර්මාන්තයේ හැමර් පරීක්ෂණ අසමත් බැවින් ගෙවීම් කල නොහැකි බව තැපැල තිබියදී සංවර්ධන නිලධාරි මඟින් දන්වා එවනවා. 2020/12/31 - අසමත් බැවින් ගෙවීම් කල නොහැකි බව බටුගෙදර ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා එවනවා. 2021/02/03 - කූට ලේඛන සකස් කරමින් අසමත් බැවින් ගෙවීම් කල නොහැකි බව ලිපි මඟින් සමිතිය වෙත දන්වා එවනවා. මෙම මාර්ග සම්බන්ධයෙන් ගිවිසුම් අනුව දෙපාර්ශවය ඉදිරියේ හැමර් පරීක්ෂණ සිදු කරන ලෙසට සමිතිය විසින් දිගින් දිගටම ඉල්ලීම් කළා. මමත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමාත් 09 වන ඡේදය යටතේ සාධාරණ හැමර් පරීක්ෂණයක් සිදු කරන ලෙසට ඉල්ලීම් කළා. එහෙත් අවස්ථාව ලබා දෙන්නේ නැහැ. එම ඉල්ලීම දිස්තික් ලේකම් කාර්යාලට ඉදිරිපත් කරනවා. එහිදී හැමර් පරීක්ෂණයට වඩා කෝකටින් පරීක්ෂණය වඩාත් හොඳ බවට දිස්තික් ලේකම්තුමිය උපදෙස් ලබා දෙමින් එතුමිය විසින් නිලධාරි බේරන්න උත්සහ කරනවා. 2020/07/19 වෙනිදා වැඩ අවසන් කල පසු එකින් එක පරීක්ෂණ ගලපනවා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු අකිල මැතිතුමාගෙන් අප සමිතිය විසින් නැවත හැමර් පරීක්ෂණයක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටිනවා. කිසි විටක පරීක්ෂණයට ඉඩ ලබා දුන්නේ නැහැ. නමුත් මෙහි තාක්ෂණ නිලධාරියා හැමර් පරීක්ෂණයට අදාල සමීකරණ දන්නේ නැහැ. සමීකරණ නොදැන වාර්තාව සකස් කර ඉදිරිපත් කලා. එම නිසා පරීක්ෂණ සිදු කල හැකි ආකාරයේ පුහුණුවක් එම නිලධාරින්ට ලබා දිය යුතු බවට මා යෝජනා කරනවා. සමිති වලට කැඳවීම් කර නැහැ. මමත් ගම්වාසීනුත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමාත් සිටියා. පරීක්ෂණ සිදු නොකර, මෙතරම්

සාක්ෂි තිබිය දී ගෙවීම් කල නොහැකි බව සමිතියට දන්වා යැවීමෙන් සමිතියේ නිලධාරීන් අසරණ වෙනවා. අපේත් රජයේත් ඉල්ලීම නිසා සමිතිය විසින් සංවර්ධන කටයුතු සිදු කළා. මෙමඟින් රජය අපකීර්තියට පත්වෙනවා. මා විසින් පසුගිය 03/31 පැවැති සම්බන්ධීකරණ කමිටුවේ දී රජය පිළිගත් ආයතනයකින් පරීක්ෂණ සිදු කිරීමට අවසර ලබා දෙන ලෙසට ඉල්ලීම් කළා. ලත් අවසරය සමඟ 04/04 දින සමිතියේ මුදල් ගෙවීම් මත පරීක්ෂණ සිදු කරනවා. මොරහැල පොල්වත්ත මාර්ගය පළවෙනි පොයින්ට් එකේදී සම්පීඩ්‍යතා අගය 28.28 කුත්, ඊළඟ පොයින්ට් එකේදී 35.5 කුත් ඊළඟ 31.84 කුත් තිබුණා. ඒත් බලාපොරොත්තු වන සම්පීඩ්‍යතා අගය වන්නේ 20 – 28 ත් අතර ප්‍රමාණයක්. ඒත් 28 ට ඉහළින් හැම අගයක්ම පැවතුණා. මෙම මාර්ග සම්බන්ධයෙන් සාධාරණ පරීක්ෂණයක් ප්‍රාදේශීය සභාව මඟින් විගණනයෙන් ඉල්ලුම් කරන්න. විගණන අධිකාරිය ස්වාධීන ආයතනයක්. එයට අත පොවන්න දිස්ත්‍රික් ලේකම්තුමියටත් බැහැ. එම වාර්තාවත්, මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්තාවත්, පදනම් කරගෙන ඒ අනුව ගෙවීම් කරන ලෙසට ඉල්ලීම් කරන්න. මේ නිලධාරීන් මාර්ග අසමත් කරලා තිබෙන නිසා පරීක්ෂණයක් සිදු කර ඔවුන්ගෙන් අය කර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කරන්න ඕන. මෙහි පිටපත් මුදල් අමාත්‍යාංශයට පසුව ඉදිරිපත් කරනවා. වංචාවක්, දූෂණයක් හෝ කාගෙ හරි අත පෙවීමක් වෙන්නත් පුළුවන්. අහිංසක සමිතිවලට ගෙවීම් කරන්න. මෙවැනි නිලධාරීන් රජයට අපකීර්තියක්. රජයේ නිලධාරීන්ට රජය අපකීර්ති වන අයුරින්, තම බලය පාවිච්චි කරමින් තමන්ට ඕන තීරණ අනුව වැඩ කරන්න බැහැ. එසේ කරන්නේනම් රජයෙන් පඩි නොගෙන සිටිය යුතුයි. ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මෙම ගෙවීම් පිළිබඳව පළාත් විගණනය නොව මධ්‍යම විගණනය (රත්නපුර සහකාර විගණන අධිකාරි වෙත) සාකච්ඡා කර අපක්ෂපාතීව කටයුතු කරන ලෙසට ඉදිරිපත් කරන්න. මීට අදාලව දිස්ත්‍රික් ලේකම්තුමිය දැනුවත් කිරීම, රජයේ විගණන අධිකාරියෙන් පරීක්ෂණයක් ඉල්ලීම, ප්‍රාදේශීය සභාව විසින් ගතයුතු පියවර වශයෙන් සඳහන් කරමින් මෙම ලිපිය සභාගත කරනවා.

මමත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමාත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ගොස් අපක්ෂපාතී පරීක්ෂණයක් සිදු කරන ලෙසට ඉල්ලීම් කලත්, තම කාලය අපතේ නොයවන ලෙසත්, සැළසුම් අධ්‍යක්ෂතුමාට මේ පිළිබඳව ඉදිරිපත් කරන ලෙසත් දිස්ත්‍රික් ලේකම් තුමිය ප්‍රකාශ කලා. එම අවස්ථාවේ දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපතිතුමාත් එහි සිටියා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් ලෙසට නොව සාමාන්‍ය මිනිසෙක් තරම්වත් මා ගණන් නොගෙන රැස්වීම් ශාලවෙන් එළියට බහින්න කිව්වා. එය අපේ සභාවට කල අපහාසයක්. ඒ ගැන මා කණගාටුව ප්‍රකාශ කරනවා. මේ සම්බන්ධව ගැටලුකාරී අවස්ථාවන් උද්ගත වූ අවස්ථාවක දී ඒ බව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති අකිල සාලිය මැතිතුමාට පැහැදිලි කරන ලෙසට එතුමන් විසින් වාචිකව ප්‍රකාශ කලා. එච්.එම්.එස්.එස්.එස්.ඒ. ගුණසේකර සැළසුම් අධ්‍යක්ෂතුමා මා සමඟ අමනාපයක් තියෙනවා විය හැකියි. මන්ද ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ලක්ෂ දහයක ප්‍රතිපාදන සහිත ව්‍යාපෘති දෙකක් 2020 වසරේ දී ලැබී තිබුණු නිසා එම ප්‍රතිපාදන ඔස්සේ මා නියෝජනය කරනු ලබන කොට්ඨාශයේ දංගස්වල වැවේ සොරොව්ව සංවර්ධනය කරන ලෙසට මා යෝජනා කලත්, එම මුදල් ඒ මහතාගේ පෞද්ගලික නිවස පිහිටි ඉඩමේ මාර්ගය අයිනේ පිහිටි පැති බැම්මක් ඉදි කිරීමට යොදාගෙන තිබුණා. මාගේ යෝජනාව ඉදිරිපත් කර තිබුණේ නැහැ. මා විසින් ඒ පිළිබඳව විමසා බැලීම හේතුවෙන් මා සමඟ පොඩි මත ගැටුමක් තිබුණා. එහි පළිගැනීමක් ලෙස මේ ගැටලුව ඇති කරන්න ඇතැයි මා විශ්වාස කරනවා. සියලු කරුණු සහා වාර්තාවට ඇතුළත් කරන ලෙසට මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
රජයේ නිලධාරීන්ට චෝදනා එල්ල කිරීමේදී ඔවුන්ගේ නම් ඉදිරිපත් කිරීම පිළිබඳව ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස මා එය අනුමත කරන්නේ නැහැ. එහෙත් එය රජය නිලධාරීන්ගේ නිදොස් කිරීමක් ද නොවෙයි. ඊට හේතුව පසුගිය සභාවාරයකදී එක් මන්ත්‍රීවරයෙක් විසින් කුඩා තේවතු සංවර්ධන නිලධාරිනියකගේ රාජකාරිය සම්බන්ධයෙන් චෝදනාවක් ඉදිරිපත් කල අතර එම චෝදනාව සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීමත් සමඟ චෝදනාව ඉදිරිපත් කල මන්ත්‍රීවරයා එම අවස්ථාවට

සහභාගී නොවීම හේතුවෙන් මා දැඩි අපහසුතාවයකට පත් වුණා. මාර්ගය නිසි ප්‍රමිතියෙන් යුතුව සංවර්ධනය කර නොමැතිනම් ගෙවීම් කිරීම සුදුසු නොවන බව මෙහිදී ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස මාද එය පිළිගන්නා අතර ම අනෙකුත් මන්ත්‍රීවරුන් ද එය පිළිගත යුතුයි. එහෙත් එම සංවර්ධන කටයුතු නිසි ප්‍රමිතියෙන් පවතීනම් ගෙවීම් නොකිරීමෙන් සමිති වලට අසාධාරණයක් සිදු වී ඇති බව ද පිළිගත යුතුයි. ගිවිසුම් ගත වූ ආකාරයට ගෙවීම් කරන්න රජය බැඳී සිටිනවා. මේ පිළිබඳව නැවත පරීක්ෂණ කරන ලෙසට මා කිහිප වාරයක් ප්‍රාදේශීය සම්බන්ධීකරණ රැස්වීමේදීත්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීමේදීත් ඉල්ලීම් කළා. නැවත පරීක්ෂණ නොකිරීම නිසා මෙම ගැටලුව දිගින් දිගටම පැවතුණා. හඬ පටිගත කිරීමේ යන්ත්‍රය සමඟ මෙම යෝජනාව පිළිබඳව සාකච්ඡා වූ කරුණු නිවැරදිව සසඳා බලා සභා වාර්තාවට ඇතුළත් කරන ලෙසට ලේකම්තුමිය ප්‍රධාන කාර්ය මණ්ඩලයට දැනුම් දෙනවා.

නැවතත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
නම් නොකරන ලද පරීක්ෂණයක් සඳහා දෙපාර්ශවයේ කරුණු සාකච්ඡා කර ලිඛිත කරුණු ඉදිරිපත් කල යුතුයි. ඊට හේතුව ගිවිසුම් පත්‍රය අත්සන් කර තිබුණේ කරුණු 19 කට අදාලව පමණක් බැවිනි.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ජනතා සුභ සිද්ධිය සඳහා පාදක වන නම් නොකරන ලද පරීක්ෂණ සඳහා අපේ කැමැත්ත පල කරනවා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙන් සාධාරණ පරීක්ෂණයක් සිදු කරන ලෙස මා ඉල්ලීම් කලා. රජයේ නිලධාරියෙකුට චෝදනාවක් ඉදිරිපත් කිරීමක දී ඔවුන් අපහසුතාවයකට පත් වන නිසා නැවත වාරයක් ඉල්ලීමක් කලේ. ඔබතුමන්ලා කැමැතිනම් පමණක් ඉදිරිපත් කල නම් ඉල්ලා අස්කර ගන්න. මා බල කරන්නේ නැහැ. විගණන අධිකාරි වෙතින් ඔබ තුමන්ලා පරීක්ෂණයක් ඉල්ලන්නේ නම් එම ඉල්ලීම විගණන අධිකාරි වෙත ඉදිරිපත් කිරීමට මා කටයුතු කරනවා. එමෙන්ම නම සහ තනතුර සඳහන් කරන ලද නිලධාරින්ට ඒ බව ලිඛිතව දැනුවත් කිරීමට සිදු වෙනවා.

නැවතත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
ගරු සභාපතිතුමනි අපි දිගින් දිගටම මේ පිළිබඳව ඉල්ලීම් කල නිසා නම් ඉදිරිපත් කිරීම ගැන අකමැති වෙන්න හේතුවක් නැහැ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
විගනකාධිපතිවරයා දැනුවත් කරන ලෙසට අප විසින් ඉල්ලීම් කළා. ඔවුන් විසින් සාධාරණව පරීක්ෂණ කටයුතු මෙහෙයවීමේ දී අවශ්‍ය වාර්තා ඉල්ලුම් කිරීමටත්, අදාල නිලධාරින් කැඳවීමටත් කටයුතු කරයි. සාක්ෂි ඉදිරිපත් කිරිමට අවස්ථාව සකසා දෙයි. එවිට එම තොරතුරු ලබා දීමට සිදු වේ. එම නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් දැනුවත් කිරීමට අවශ්‍ය වන්නේ නැහැ.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
මෙම මාර්ග පහම පළාත් පාලන ආයතනය සතුවන බැවින් ගනු ලබන සෑම ක්‍රියාමාර්ගයන් පිළිබඳවත්, එහි ප්‍රගතිය පිළිබඳවත්, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව දැනුවත් කිරිමට පියවර ගන්නා ලෙස දන්වා යැවීමට කටයුතු කරනවා.

## (04). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## (05). යථා පරිදි කල් දී ඇති යෝජනා.

(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ර/බල/ මාමල්ගහ විද්‍යාලය 1950/05/22 වන දින මාමල්ගහ විහාරස්ථානයේ දී ආරම්භ කල බවත්, එහිදී මූලික වී කටයුතු කල එවකට මාමල්ගහ

විහාරස්ථානයේ විහාරාධිපතිව වැඩ විසූ ධීරානන්ද ස්වාමීන් වහන්සේට උපහාරක් ලෙස විදුහලේ නාමය වෙනස් කිරීමට 2022/03/08 වන දින පැවැති පාසල් සංවර්ධන විධායක කමිටුව විසින් ඒකමතිකව තීරණය කරන ලද බවත්, එම යෝජනාව නැවත 2022/03/25 පාසල් සංවර්ධන සමිතිය විසින් ද ඒකමතිකව සම්මත කරන ලද බවත් සඳහන් කරමින් දැනට ර/බල/මාමල්ගහ විද්‍යාලය ලෙසට භාවිතා කරනු ලබන පාසල් නාමය ර/බල/ශ්‍රී ධීරානන්ද ප්‍රථමික විද්‍යාලය ලෙස නාමය වෙනස් කිරීමට ඔබතුමාගේ විරෝධතාවයක් නොමැති බවට අනුමැතිය ලබා දෙන ලෙසට ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින්,
උන් වහන්සේ ගමට සේවය හා මෙහෙවර ඇගයීම සඳහාත්, උන් වහන්සේට උපහාරයක් පිණිසත් ඉදිරිපත් කර ඇති නමින්, පාසලේ නම වෙනස් කිරීම සුදුසු බවට යෝජනා කරමින් ඒ පිළිබඳව විරෝධතා සහ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන බව ප්‍රකාශ කරමින්, පාසලේ නාමය වෙනස් කිරීම පිළිබඳව මාමල්ගහ විහාරස්ථානයේ විහාරධිපති ස්වාමීන් වහන්සේට, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති අකිල සාලිය එල්ලාවල මැතිතුමාට, බලංගොඩ කලාප අධ්‍යාපන කාර්යාලයට, ඉඹුල්පේ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දන්වා යැවීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව දැනට ර/බල/මාමල්ගහ විද්‍යාලය යන නාමය වෙනුවට ර/බල/ශ්‍රී ධීරානන්ද ප්‍රථමික විද්‍යාලය ලෙස නාමය වෙනස් කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ii). 2021 වර්ෂයේ අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත පාසල් සිසුන් සඳහා 2022/05/11 වන දින ර/ උඩගම මහා විද්‍යාලයීය ශ්‍රවනාගාරය තුල පෙ.ව. 09.00 සිට දහවල් 12.30 දක්වා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ කුමරතුඟු මහජන පුස්තකාලයේ මූලිකත්වයෙන් මනෝ උපදේශන වැඩසටහනක් පැවැත්වීමටත් ඒ සංග්‍රහ වියදම්, සම්පත් දායකයකයින් හා ආරාධිතයින් සඳහා සංග්‍රහ වියදම් සඳහා (දිවා ආහාරය ලබා දීම, ත්‍යාග ලබා දීම), වෙනත් වියදම් වලට අදාලව රු. 93 340.00 කින් යුතුව ඉදිරිපත් කරන ලද දළ ඇස්තමේන්තුව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරිපත් කරන ලද දළ ඇස්තමේන්තුගත මුදල අනුමත කිරීම සුදුසු බව ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

ඒ අනුව ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ කුමරතුඟු මහජන පුස්තකාලයේ මූලිකත්වයෙන් 2021 වර්ෂයේ අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත පාසල් සිසුන් සඳහා මනෝ උපදේශන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරිපත් කර ඇති රු. 93 340.00 කින් යුතු දළ ඇස්තමේන්තුව අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (06). කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

## (06). (i). ගෙවීම අනුමත කිරීම.

මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද මාර්තු මස 01 වන දින සිට මාර්තු මස 31 වන දින දක්වා ගෙවීම් කරන ලද අනු අංක 1 - 119 සහ වවුචර් අංක 168 සිට 297 දක්වා ගෙවීම් විස්තර වාර්තා සහ වවුචර් උපලේඛන 2022.04.01. වන දින පැවැති මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, මුදල් කමිටුවේ අනුමැතිය ලත් එම වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමින් එම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී .
ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් මුදල් කමිටුවේ නිර්දේශ ලද වවුචර් වාර්තා සහ මුදල් කමිටු වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව මුදල් කමිටු අනුමැතිය ලත් වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව අනුමත කිරීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව සභා සම්මත විය.

## (06). (ii). ටෙන්ඩර් මණ්ඩල වාර්තාව ඉදිරිපත් කිරීම.

2022.04.01. දින පැවැති ප්‍රසම්පාදන කමිටුව විසින්,

01. දීර්ඝ කාලයක් තුල භාවිතා නොකර අත්හැර දමා අබලන් ව පැවැති රන්මුදුඹය කම්බි පාලම ගලවා එහි යකඩ විකිණීම සඳහා මිල ගණන් කැඳවීම.
02. ප්‍රධාන කාර්යාලය තුල සවි කිරීම සඳහා එල්.ඊ.ඩී විදුලි බුබුළු මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
03. ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් සවි කිරීම අළුත්වැඩියා කිරීම සඳහා වීථි පහන් උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
04. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ජල ව්‍යාපෘති නඩත්තු කටයුතු සඳහා ජල නල හා උපාංග මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
05. ප්‍රධාන කාර්යාලයේ කටයුතු සඳහා ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
06. හියුම් පයිප්ප නිෂ්පාදන කටයුතු සඳහා සිමෙන්ති මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
07. ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි 02 අතර කාණු පද්ධතිය සඳහා යකඩ දැල් ආවරණයක් සකසා සවි කිරීම වෙනුවෙන් මිළ ගණන් කැඳවීම.
08. බල ප්‍රදේශය තුල ස්ථිර දැන්වීම් පුවරු ඉදි කිරීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමට අදාල වූ ප්‍රසම්පාදන කමිටු වාර්තාව සහා අනුමැතිය ලබා ගැනිම සඳහා ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (07). ආදායම් වියදම් වාර්තාව

2022 මාර්තු මස ආදායම් වියදම් වාර්තාව මහ සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## (08). වෙනත් කරුණු.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
(i). ඉඹුල්පේ බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කරනු ලබන ප්‍රමුඛ ව්‍යාපෘතියක් වන පින්නවල කුඩා නගරය ඉදි කිරීම පිළිබඳව සෑම සභා වාරයකදීම එහි ප්‍රගතිය සාකච්ඡා කල යුතු බව පසුගිය සභාවාරයේ දී තීරණය කරන ලදි.
ඒ අනුව වත්මන් ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයක් අනුව ක්‍රියාත්මක වන සියක් නගර වැඩසටහනට පින්නවල නගරය තෝරාගෙන ඇති බව සභාව වෙත දැනුම් දී ඇති අතර ඒ අනුව

නාගරික සංවර්ධන අධිකාරිය විසින් නගරය පරීක්ෂා කිරීම සඳහා පැමිණියා. එහිදී යෝජිත නගර සංවර්ධනය සඳහා මුදල් වෙන් කර ඇති බවත් එමඟින් නගරය වටා ආරක්ෂිත වැටක් ඉදි කර මල් පෝච්චි තබා නගර අලංකරණ කටයුතු සිදු කිරීමටත්, අධිකාරිය සතුව පවතින මුදල් මෙම වසර තුල වියදම් කල යුතු බවත් ප්‍රකාශ කර තිබුණා. මේ අවස්ථාව වන විට පින්නවල නගරය අලංකරණ කටයුතු සඳහා මුදල් ප්‍රතිපාදන අවශ්‍ය නොවන බැවින් එම ප්‍රතිපාදන හරහා නගරය වටේ බැම්මක් ඉදි කර පස් පුරවා සංවර්ධනය කර දෙන ලෙසට ඉල්ලීම් කලා. ලැබුණු මුදල් ආපසු හරවා යැව්වේ මන්දැයි ඔබතුමන්ලාට මාගෙන් විමසිය හැකියි. එහෙත් මෙම පින්නවල නගර සැලසුම් ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර අවසන් කරනවා වෙනුවට පැලැස්තර ඇලවීම තුලින් විසඳුම් නොයෙදි යුතු බව මාගේ අදහසයි.
එමෙන්ම ඉඩම් හඳුනාගෙන අවශ්‍ය නිර්දේශ ලබා දෙන ලෙසට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් රත්මලවින්න ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙතින් ඉල්ලීම් කර තිබෙනවා.
පින්නවල ඉඩම අත්පත්කරගැනීමට අදාලව තක්සේරු දෙපාර්තුමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති ලක්ෂ විසිපහක මුදල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත තැන්පත් කිරීමට සිදු වි ඇත. එම මුදල හෝ එහි යම් ප්‍රතිශතයක් ගෙවීමට පෙර ඒ පිළිබඳ තොරතුරු සභාව වෙත ලබාදෙන ලෙසට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දන්වා යවා ඇත.
එමෙන්ම මෙම නගර සැළසුම කඩිනමින් හා කාර්යක්ෂම ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය සමබනධිකරණ අනු කමිටුවක් පත් කරන ලෙසට ද ඉල්ලීම් කර තිබෙනවා.
නාගරික සංවර්ධන අධිකාරිය විසින් පින්නවල නගරය සංවර්ධනය කිරීම සඳහා රුපියල් ලක්ෂ දෙසීයක මුදලක් ලබා දෙන බව ප්‍රකාශ කලා. ඉදිරි නගර සංවර්ධන කටයුතු සඳහා සභා අරමුදලින් හෝ නාගරික සංවර්ධන අධිකාරියෙන් මුදල් ප්‍රතිපාදන වෙන්කරවාගෙන සංවර්ධන කටයුතු නිමා කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

(ii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
මා කැපොක්වත්ත කසල අංගනයේ සංවර්ධන කටයුතු සොයා බැලීමේ අධීක්ෂණන මන්ත්‍රීවරයා ලෙස පත් කලත්, කසල නිසි පරිදි කළමනාකරණය කර පොහොර නිෂ්පාදනය සඳහා ස්ථිරව එම ස්ථානයට සේවකයින් නොයෙදවීම, කසල සැකසීම සඳහා අවශ්‍ය උපකරණ සහා අරමුදල් මඟින් නොගැනීම (විශාල කසල ප්‍රමාණයක් ඉවත් කිරීමට සිදු වීම), මේ අවස්ථව වන විට නිමි පොහොර බවට පත්කල හැකි කසල විශාල ප්‍රමාණයක් පුස් හැඳී විනාශයට පත් වීම, නව ඉදිරිකිරීමක් ලෙස පැති බැම්මක් ඉදි කලත් එය නිසි ප්‍රමිතියකට ඉදි නොකිරීම. ගමේ කිහිපදෙනෙක් එම ස්ථානයේ වැඩ කරන අතර ඔවුන්ගෙන් එම ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරු පිළිබඳව විමසා සිටියත් කොන්ත්‍රාත්කරු පිළිබඳව සත්‍ය ප්‍රකාශ කලේ නැහැ. එක් දිනක් මා එහි යමින් සිටියදී නිසි ප්‍රමිතියෙන් තොරව පැතිබැම්මට කොන්ක්‍රීට් යෙදීම පිළිබඳ අක්‍රමිකතාවයක් දුටුවා. නිවෙස් වලින් බැහැර කරනු ලබන කසල වල ලුණු සාන්ද්‍රණය වැඩි නිසා මෙම ස්ථානය අසල ඉදිකිරිම් දිරාපත් වීමේ ප්‍රවනතාවය වැඩියි. එනිසා බැම්මට අලාභහානි විය හැකියි. එම පැතිබැම්ම ඉදිකිරීම පිළිබඳව සෑහීමකට පත් වෙන්න බැහැ. මා දන්නා තරමින් සාමාන්‍ය කොන්ක්‍රීට් බැම්මකට අගල් 4 ගල් යොදන්නේ 20% කි. කොන්ක්‍රීට් මිශ්‍රණය 80% කි. මෙම පැති බැම්ම ඉදිකරනු ලබන කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවීම පිළිබඳව මා විරෝධතාවය ප්‍රකාශ කරන අතර ඉදි කිරීම් පිළිබඳව පරීක්ෂා කර තහවුරු කිරීමෙන් අනතුරුව ගෙවීම් කරන්න. එම පැති බැම්ම කළු ගල් බැම්මක් ලෙස අක්‍රමවත්ව ඉදිකිරීම පිළිබඳව මා කණගාටුවට පත් වෙනවා. බැම්මට හානිවීමෙන් එම ස්ථානයේ සේවය කරනු ලබන සභාවේ සේවක මහතුන් පවා අනතුරකට ලක් විය හැකිය. එම ස්ථානයේ අධීක්ෂණ මන්ත්‍රීවරයා ලෙස මා එහි සිටීමෙන් සිදුවන අනතුරුවලට පවා වගකීමට බැඳෙන බැවින් ඒ පිළිබඳව මා සභාව දැනුවත් කර එම තනතුරෙන් ඉල්ලා අස්වීමට තීරණය කළා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
කැපොක්වත්ත කසල අංගනය තුල ඉදිකරණු ලබන එම පැති බැම්ම සඳහා ආධාරක භාවිතා කර තිබෙනවා ද?

සභාපතිතුමා අදහස් දක්වමින්,
රජය විසින් මහජන මුදල් වලින් සංවර්ධනය වැඩි දියුණු කිරීම සඳහා ඉදිකිරීම් කටයුතු සිදු කරනවා. එම ඉදිකිරීම්වල අක්‍රමිකතා සිදුවන්නේ නම් කාර්මික නිලධාරි මහතාට යොමු කර ඒ පිළිබඳව සොයා බලා වාර්තාවක් කැඳවීමටත් එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කරනවා. එමෙන්ම සභාපතිවරයා ලෙස මම, මෙහි සිටින ගරු උප සභාපතිවරයා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය තාක්ෂණය පිළිබඳ තොරතුරු නොදන්නා බැවින්, තාක්ෂණ නිලධාරි ලවා පරීක්ෂා කිරීමට කටයුතු කරනවා. කසල අංගනයේ පැති බැම්ම ඉදි කිරීම පිළිබඳවත් ඒ සඳහා ආධාර සැපයීම පිළිබඳව කාර්මික නිලධාරි මහතා විසින් තීරණය කල යුතු බැවින් කාර්මික නිලධාරිගෙන් වාර්තාවක් කැඳවන ලෙසට ලේකම්තුමියට උපදෙස් දෙනවා

.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමා නැවත අදහස් දක්වමින්,
මෙම ස්ථානය අධීක්ෂණය කිරීම සඳහා මන්ත්‍රීවරු කිහිප දෙනකේ පත්කලා. ඒ අසලින් යන මන්ත්‍රීවරුන් සිටිනවා. ඔවුන් එහි යනවාදැයි මා නොදන්නා අතර මට මුණ ගැසී නැහැ. ඒ පිළිබඳව සොයා බලන්න ඔවුන්ටත් අයිතියක් තියෙනවා. ඔබතුමා කාර්මික නිලධාරි මහතා අධීක්ෂණ කටයුතු සඳහා සහභාගී වී තිබුණා. එහෙත් අප කිසිවෙක් එහි නොසිටින අවස්ථාවන් වලදී තමයි මෙම කටයුතු හදිසියේ සිදු වන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
කාර්මික නිලධාරි විසින් තාක්ෂණය පිළිබඳව අධීක්ෂණ කටයුතු සිදු කල යුතුයි. එහෙත් සමස්තයක් ලෙස කැපොක්වත්ත කසල අංගනයට සංවර්ධන කටයුතු සඳහා විශාල මුදලක් වැය වී තිබෙන අතර එම වියදමට සරිලන ප්‍රතිඵල එහි පවතිනවාද ? ඒ ප්‍රශ්නය මට ඇති වෙලා තිබෙනවා. පරීක්ෂණයකින් තොරව දඩාවතේ යන ව්‍යාපෘතියක් වැනි ද? ඒ සඳහා මුදල් අයතා ලෙස පරිහරණය වී තිබෙනවා ද? එම ස්ථානයේ කසල රැස් කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කළේ ප්‍රදේශයේ ජනතා විරෝධතා මැදයි. එම පළාතට මැස්සන්ගෙන් හානිදායකයි. මෙම මධ්‍යස්ථානය මහජන මුදලින් ස්ථාපිත වූ නිසා එම මහජන මුදල් විනාශ වෙන්න දෙන්න බෑ. කරුණාකරලා ඔබතුමා කාර්මික නිලධාරිට යොමුකර, නිසි පරිදි දැනුවත් කර, නිසි පරීක්ෂණයක් ක්‍රියාත්මක කරන්න. යෙදවූ මුදල් පිළිබඳවත් එහි වටිනාකම පිළිබඳවත් ඊළඟට තියෙන මුදලේ පරතරය පිළිබඳවත් සොයා බලන්න. මේවා අධීක්ෂණය නොවන්නේ තාක්ෂණ නිලධාරිතුමාගේ දුර්වලතාවයක් ද සභාවේ දුර්වලතාවයක් ද යන්න අප විසින් විමසා බැලිය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
අප විසින් හොඳ තත්ත්වයේ නිෂ්පාදන මහජනතාවට ලබා දිය යුතුයි. රැකියා ලක්ෂයේ වැඩපිළිවෙල සඳහා බඳවාගත් පිරිසෙන් විසි දෙනෙක් පමණ ඉල්ලුම්කරන ලෙසත් ඔවුන් කැපොක්වත්ත කසල අංගනයේ සංවර්ධන කටයුතු සඳහා යොදවන ලෙසට මා යෝජනාවක් ඉදිරිපත් කලා. එහෙත් අදවනතුරු එම යෝජනාව ක්‍රියාත්මක වී නැහැ. පිටරටින් රසායනික පොහොර ගෙන්වීමට මුදල් වැය කිරීම අපරාදයක්. නිෂ්පාදන ධාරිතාවය ඉහළ දමන්නේනම් රටට අවශ්‍ය කාබනික පොහොර රට තුල නිපදවා ගැනීමට හැකියාව පවතිනවා. රජයේ වැටුප් ලබන්නන්ගේ නිසි කළමනාකාරීත්වයක් නොතිබීම නිසා ගැටලු මතු වෙලා. රැකියා ලක්ෂයේ වැඩසටහන අනුව බඳවා ගත් අයගෙන් සමහර අය කියනවා ඊයේ අපි වැඩට ගියානේ අද යන්න අවශ්‍ය නැහැ කියලා. එසේ ප්‍රකාශ කරන අය සිටියදී ඔවුන්ගේ ශ්‍රමය මේ සඳහා යොදා ගත යුතුව තිබුණා. නිසි කළමනාකරණයක් නොමැතිව පැති බැම්ම ඉදිකිරීම නිසා කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් නොකරන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමා ඉල්ලීම් කලා. මම ද එම යෝජනාවට එකඟතාවය පල කරනවා. නිසි පරීක්ෂණයකින් පසුව ගෙවීම් කරන්න. මා පමණක් නොව ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රී මණ්ඩලය ද ඊට එකඟ වනු ඇතැයි මා සිතනවා. එම ස්ථානයේ අධීක්ෂණ කමිටුවට මමත් මුල් වකවානුවේ සහභාගී වුණා.

(iii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
කුඩා තේ වතු සංවර්ධන නිලධාරිතුමියකගේ රාජකාරී පිළිබඳව මා විසින් යෝජනාවක් ඉදිරිපත් කරමින් ඒ සඳහා නිසි පරීක්ෂණයක් කරන ලෙසට ඉල්ලීම් කලා. ඒ පිළිබඳව ඉඹුල්පේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කලත් නිසි ක්‍රියාමාර්ග නොගැනීම ගැටලුවක්. සභාවේ මන්ත්‍රී මණ්ඩලයේ විසිපස් දෙනා ඉදිරිපත් කරන යෝජනා පිළිබඳ සලකා නොබැලීම ගැටලුවක්. එම නිසා කුඩා තේවතු සංවර්ධන අධිකාරි දිස්ත්‍රික් කළමනාකරු, රත්නපුර වෙත ඒ පිළිබඳව නිසි පරීක්ෂණයක් සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දැනුවත් කරන්න.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාව හතළිස් හතර දහසකට ආසන්න වන අතර මෙම සභා බල ප්‍රදේශය මධ්‍යම ආණ්ඩුවෙන් පාලනය වන්නක්. වෙනම රාජ්‍යක් නොවෙයි. මෙහි ජීවත්වන දරුවොත් රත්නපුර ප්‍රදේශයේ ජීවත්වන දරුවොත් කිරි බොන්නේ එකම මිලකටයි. ඒ අනුව බල ප්‍රදේශය තුල පිහිටි උඩගම කණිෂ්ඨ විද්‍යාලයට මේ අවස්ථාව වන විට, 3 ශ්‍රේණිය සිංහල කියවීම පෙළ පොත සහ, 5 ශ්‍රේණිය සිංහල කියවීම පෙළ පොත නොමැතිවීම, 8 ශ්‍රේණිය ප්‍රායෝගික තාක්ෂණික කුසලතා පෙළ පොත, 10 ශ්‍රේණිය ඉංග්‍රීසි පෙළ පොත නොමැතිවීම, ඉඹුල්පේ ශාරිපුත්‍ර විද්‍යාලයට මේ අවස්ථාව වන විට එක් සමාන්තර ශ්‍රේණියකට පෙළ 07 ක් පමණක් ලැබී තිබීම නිසා සිසු දරුවන්ගේ අධ්‍යාපනයට පවා බාධා එල්ල වෙමින් පවතිනවා.
මේ දින වල රට තුල පවතින ජනතා විරෝධතාවයන් සමඟ එ.ජා.ප. ලෙසත් විපක්ෂය ලෙසත් ආණ්ඩුවට විරෝධය ප්‍රකාශ කරන අතර අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ගෙදර යන්න ඕන, වත්මන් ආණ්ඩුව ගෙදර යන්න ඕන කියන මතයේ අපි සිටිනවා. මේ ඉදිරිපත් කරන්නේ ජාතික මට්ටමේ දේශපාලනයක් නොවෙයි. ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්රදේශයේ දරු පැටවුන් සහ ජනතාව ආරක්ෂා කර ගත යුතුයි. පැහැදිලිවම විපක්ෂය ලෙස ආණ්ඩුවට විරෝධය ප්‍රකාශ කරනවා.

(iv). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය අදහස් දක්වමින්,
ගරු සභාපතිතුමනි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා කුඩා තේවතු සංවර්ධන නිලධාරිතුමිය පිළිබඳව මන්ත්‍රී මණ්ඩලයේ විසිපස්දෙනාගේ විරෝධාවය ප්‍රකාශ කරන බව පවසමින් ඒ බව රත්නපුර කුඩා තේ වතු දිස්ත්‍රික් කළමනාකරු වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කලත් මා ඊට විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. එම නිලධාරිනිය ගර්භණී තත්ත්වයක සිටිමින් වුවද මා නියෝජනය කරන කොට්ඨාසය තුල කඳු පල්ලම් නොබලා ගමන් කරමින් තම රැකියාවේ නියැලෙන අයුරු මා සියැසින් දුටුවා. අදාල ස්ථාන වලින් තේ පැළ ගෙන ඒමට ද එම නිලධාරිය සහභාගි වෙනවා. එතුමන් විසින් කිහිපවාරයක් සභාවට මේ පිළිබඳව කරුණු ඉදිරිපත් කලත් මා නිහඬව පසුවුණේ එතුමාගේ ගැටලුව එතුමාට නිරාකරණය කිරීමට අවස්ථාව ලබා දිය යුතු නිසයි. එහෙත් මම එතුමාගේ ප්‍රකාශයට විරුද්ධයි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමියගේ අදහස් දැක්වීම අතරතුර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා නැගීසිටිමින් නැවතත් අදහස් දක්වමින්,
මේ අවස්ථාවේ දී මා විසිපස් දෙනා යනුවෙන් සඳහන් කලේ මෙම යෝජනාව පිළිබඳව නොවේ. මන්ත්‍රී මණ්ඩලයේ විසිපස් දෙනා ඉදිරිපත් කරන වෙනත් යෝජනාවක් වුවත් සලැකිල්ලට භාජනය නොකිරීම පිළිබඳවයි. ක්‍රියාමාර්ග නොගැනීම පිළිබඳව පැහැදිලි කිරීමටයි මා එසේ සඳහන් කලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යෝජනා පමණක් ඉදිරිපත් කිරීමේ දී එම යෝජනා පැහැදිලිව හා ලිඛිත සාක්ෂි සහිතව ඉදිරිපත් කල යුතුයි.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ජනතාවට අසාධාරණයක් වන බව වාර්තාවන අවස්ථාවලදී ඒ බව සභාවට යෝජනා ඉදිරිපත් කිරීම මහජන නියෝජිතවරුන්ගේ වගකීමයි. එහෙත් එවැනි අවස්ථාවල් වලදී කිසිවෙකුගේ කිසිවෙකු ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමේ දී ඒ හා සම්බන්ධ සියලුම දෙනා එම චෝදනාවට බැඳෙනවා. සභාපතිවරු, මන්ත්‍රීවරු හොරකම් කරනවා යැයි චෝදනා කළොත් එම සියලු දෙනාම හොරු ලෙස නම් ප්‍රකට වෙනවා. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225 දෙනා මහජන මුදල් සොරාගත් බව ප්‍රකාශ කලාම සියලු දෙනාටම එම සොර නාමය පොදුයි. එහෙත් රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා සත පහක් සොරකම් කර නැති බව වගකීමෙන් යුතුව මා ප්‍රකාශ කරනවා. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න  මැතිතුමාගේ ඉල්ලීම පරිදි කුඩා තේවතු සංවර්ධන නිලධාරිනියකගේ රාජකාරී කටයුතු සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙසට කුඩා තේවතු සංවර්ධන දිස්ත්‍රික් කළමනාකරු වෙත දන්වා යැවීමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න  මැතිතුමා අදහස් දක්වමින්,
මෙම කරුණ සම්බන්ධයෙන් මා සතුව සාක්ෂි පවතිනවා. පරීක්ෂණය කැඳවීමෙන් පසුව සාක්ෂි ඉදිරිපත් කිරිමට මා සූදානමින් සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක  මැතිතුමිය අදහස් දක්වමින්,
මෙම නිලධාරිනිය අමුවතුගොඩ වසමේ කීනගහඇල්ල ඉඩම් කොටසේ තේ වගා කරලා තියෙනවා. තේ පැළ සිටුවීමට පෙර පැගිරි මානම් වගා කිරීමට අවශ්‍ය බව කලින් දැන සිටියත් වර්තමාන නීතිය දන්නේ නැහැ. මෙම ඉඩම්වල දෙවැනි වරට තේ වගා කරන පුද්ගලයා වටේට ඇති ඉඩම් අල්ලාගෙන ක්‍රියා කරනවා. කුඩා තේවතු සංවර්ධන නිලධාරිනියකගේ රාජකාරී කටයුතු සම්බන්ධව ඉදිරිපත් කල චෝදනාවෙන් මම ඉවත් වෙනවා.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
රජයේ නිලධාරියෙකුට චෝදනාවක් ඉදිරිපත් කලත්, ඒ හා සම්බන්ධ පරීක්ෂණයකින් තොරව වරදකරුවෙක් යැයි ප්‍රකාශ කල නොහැකියි.

(v). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද්  මැතිතුමා අදහස් දක්වමින්,
මීට සභාවාර හතරකට පෙර පින්නකන්ද මාර්ගය කඩිනමින් සංවර්ධනය නොකිරීම පිළිබඳව මා විසින් සභාවට යෝජනාවක් ඉදිරිපත් කලා. මාර්ගය සංවර්ධනය කිරීමේ දී බෝක්කු සවි කිරීම ආරම්භ කර ඇතත් ඒවා තවම සවි කර අවසන් කර නැහැ. කිසිම වාහනයකට එම මාර්ගය තුල ගමන් කිරීමට නොහැකි තත්ත්වයක් උදා වෙලා. ජේ.සී.බී. යන්ත්‍ර භාවිතය නිසාත්, වැස්ස නිසාත් මාර්ගය මඩ වෙලා පවතිනවා. මාස හයක හතක සිට බස්ධාවනය වන්නේ නැහැ. පාසල් දරුවන් ඉතාමත් අසරණ තත්වයට පත් වෙලා.
මේ කන්නය තුල වගා කරන ලද ගොයම් මේවන විට කපා අවසන් වෙලා. මේ කන්නයට පෙර එක් කුඹුරකින් වී කාර්තු සියයක පමණ අස්වැන්නක් නෙලා ගත්තත් මේ කන්නයේ දී වී අස්වැන්න කාර්තු විස්සට බැහැලා. අස්වැන්න අඩු නිසා වගා කරන ලද කුඹුරු අක්කර ගණනක් වගා නොකර අත් හැරලා දමා තිබෙනවා. කොම්පොස්ට් රු. 2000 කට දීලා, ඩීසල් මඟින් ගොයම් මඩින මැෂිමට කුළිය ගෙවුවාම ගොවියාට පරිභෝජනය සඳහා වී ඉතිරි වන්නේ නැහැ. ගොවිජනතාවට පොහොර සහනාධාරය නැවත ලබා දෙන්න. ඩීසල් ගණන් නිසා ජන පීඩිත ආණ්ඩුවට විරෝධය ප්‍රකාශ කිරීම සඳහා අද දින මාසික මහ සභාවට කළු ඇඳගෙන පැමිණියා. පක්ෂ විපක්ෂ වුවද මන්ත්‍රීවරුන් වන අපිටත් ගෙවල් වල හැංගිලා ඉන්න වන යුගයක් උදා වෙලා. ඒ තත්ත්වය උදාවෙන්න පෙර පුළුවන් කෙනෙකුට රට භාර දීලා ජනාධිපතිතුමාට ගෙදර යන්න කියා මා ප්‍රකාශ කරනවා.

(vi).ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක  මැතිතුමිය අදහස් දක්වමින්,

ජන පීඩිත ආණ්ඩුවට විරෝධය ප්‍රකාශ කිරීම සඳහා අද දින මාසික මහ සභාවට කළු ඇඳගෙන පැමිණියා. වෙළඳපල භාණ්ඩවල මිල ඉහළ යාම ගෙදරක ගෘහනියට වැඩිපුරම දැනෙනවා. මේ රට කෘෂිකාර්මික රටක්. කෘෂිකර්මාන්තය සම්පූර්ණයෙන් අතැරලා දැම්මොත් රට නැගිටින්නේ කෙසේ ද? මේ දිනවල පවතින වැස්ස නිසා වතුවල යම් තරමකින් තේ දළු තිබෙනවා. වැස්ස අඩු වූ විට තව ටික දවසකින් ඒ ටිකත් නැතිවෙලා යයි. වී අස්වැන්නත් අඩුවෙලා. කාබනික පොහොර ලැබුණෙත් නැහැ. දියර පොහොර සහ රතු කුඩු පමණක් ලැබුණා. මේ පිළිබඳව පක්ෂ විපක්ෂ භේදයකින් තොරව කතා කල යුතුයි. අස්වැන්න පාඩු වුණාම වන්දි මුදල් ගෙවනවා කිව්වත් ඒවා කට වචනයක් මිස ක්‍රියාත්මක වීමක් නැහැ. ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් එපා කියලා මිනිස්සු පාරට බැහැලා උද්ඝෝෂණය කරනවා. ගොවියන්ට පොහොර ලබා දිය යුතුයි. ජනතාවට සහන මිලට ඩීසල් ලබා දිය යුතුයි. සෑම පාසලකම දරුවන්ට නිල ඇඳුම් සහනාධාරය ලබා දී නැහැ. ශිෂ්‍යත්වය සමත්ව වෙනත් පාසල් වලට ගිය දරුවන්ට ලැබිලා නැහැ. මීට පසුව අපිට දේශපාලනය කරන්න බැරි තත්ත්වයකට පත් වෙලා. ඉදිරි කාලය තුලදී ප්‍රාදේශීය මහජන නියෝජිතවරුන් වල අපටත් ගම් වල ගෙවල්වලට වී හැංගිලා ඉන්න සිදු වෙයි. ජනාධිපතිතුමාට රට භාර දීලා ගෙදර යන්න කියා මා ප්‍රකාශ කරනවා. කොට්ඨාසයතුල ඇති වසමකට යන්න විලි ලැජ්ජයි. මිනිසුන්ට දේශපාලනය අප්පිරියා වෙලා ඉන්නේ. මහජන නියෝජිතවරු ලෙස සභාව නියෝජනය කරමින් ලබා ගන්න වැටුපවත් අපට පල දිමක් නැහැ. ඒ නිසා ජනතාව වෙනුවෙන් කල හැකි දේ කරමු.

(vii).ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය අදහස් දක්වමින්,
වත්මන් ආර්ථික තත්ත්වය පිළිබඳව වතුකම්කරු කාන්තාවක් ලෙස හොඳට ඇඟට පතට දැනෙනවා. ගිය මාසේ වෙළඳසැලට ගොස් රු. 15000.00 ට ගන්නා ලද භාණ්ඩ මේ මාසේ මිලදී ගැනීමට රු. 20000.00 ක් අවශ්‍ය වුණා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරියන්ට මේ පිළිබඳව දැනෙනව ද දන්නේ නැහැ. එතුමියන්ට මේ පිළිබඳව දැනෙනවානම් ඉදිරිපත් කරන්න තිබුණා. වතුකම්කරුවන්ට වෙනත් ආදායම් මාර්ග නැහැ. අනෙකුත් අයට මේ පිළිබඳව නොතේරුණත් අපිට ඒක හොඳට දැනෙනවා. වතුකම්කරුවන් බත් වෙනුවට රොටී කන්නේ. ඊයේ රාත්‍රියේ ප්‍රවෘත්ති මඟින් පිටි මිල රු. 50 කින් ඉහළ යන බව විකාශනය වුණා. වතුකම්කරුවන්ගේ බඩට මෙය කෙලින්ම දැනෙනවා. ආණ්ඩු පක්ෂය වෙන්න පුළුවන්, විපක්ෂය වෙන්න පුළුවන් ඔබතුමන්ලාටත් මෙය දැනෙන්න ඕන. ඔබතුමාලටත් විරෝධය ප්‍රකාශ කිරීමට අවස්ථාව තිබෙනවා. අපි මෙපමණ කාලයක් නිහඬ වෙලා හිටියා. මේ ගැන කතා කල යුතු කාලය දැන් එළඹිලා. ආර්ථික පීඩනයට එරෙහිව ඔබතුමන්ලාත් නැගී සිටින්න. ජනතා හඬට කන් දෙන්න. ජනතාව පක්ෂ භේදයකින් තොරව පාරට බැහැලා ඉන්නේ. ප්‍රවෘත්ති විකාශනයන් තුලින් මාධ්‍යතුලින් ආර්ථික අර්බුධය පිළිබඳව ජනතා පීඩනය අප දකිනවා. මෙය උසි ගැන්වීමක් කියලා සමහරු කියනවා. එසේ කිව්වත් මෙය මනුෂ්‍යත්වයේ හැඟීම් ප්‍රකාශ කිරීමක්. රජය විසින් ගෙනයනු ලබන අක්‍රමවත් වැඩපිළිවෙලට මම සම්පූර්ණ විරෝධතාවය ප්‍රකාශ කරනවා. ජනතාව පිළිබඳ හැඟීමක් නොමැති ජනාධිපතිවරයෙක්. එතුමාට ආණ්ඩුව කළමනාකරණය කරන්න බැරිනම්, විකල්පයක් නැත්නම් රට පාලනය කරන්න පුළුවන් කෙනෙකුට දීලා ගෙදර යන්න කියා මා ප්‍රකාශ කරනවා.

(viii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීපී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමා අදහස් දක්වමින්,
වර්තමානයේ දී ජනාධිපති ගෝඨාභය මැතිතුමාට සමාජය තුලින් විශාල විවේචනයක් එල්ල වී තිබෙනවා. එතුමා ආරක්ෂක ලේකම් ධූරයේ කටයුතු කරන අවධියේ දී එතුමා එම කටයුතු නිවැරදිව කල නිසා ආරක්ෂක ලේකම් තනතුරට එතුමා ගැලපෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රී, කුමාර වෙල්ගම මැතිතුමා, පාර්ලිමේන්තු මන්ත්‍රී, වාසුදේව නානායක්කාර මැතිතුමන්ලා එතුමා ජනාධිපති අපේක්ෂකයා ලෙස පත් නොකරන ලෙසට වත්මන් අග්‍රාමාත්‍යතුමාට පැහැදිලිවම ප්‍රකාශ කලා. බලපෑම් කලා. රටතුල උද්ගතව පවතින මේ ප්‍රශ්නයට වත්මන් අග්‍රාමාත්‍යතුමා වගකියන්න ඕන. ඕනෙම පුද්ගලයෙකුගේ හොඳ නරක තියෙන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, යම් කාලවකවානුවකදී ඔබතුමාට හෝ මට වරදින්න පුළුවන්. කොරෝනා වසංගත තත්ත්වය නිසා රට යම් තරමකට වැටුණා තමයි. එහෙත් අපේ රට මෙන්ම ලොව අන් රටවලුත් කොරෝනා වසංගතයට ගොදුරු වුණා. ඒ රටවල්වලත් ආර්ථිකය කඩා වැටුණා. ඒත් රටවලින්

පවා අපේ රටට ආධාර ලබා ගත්තා. ඇයි අපේ ආර්ථිකය එහෙම පහළට වැටුණේ? මිනිස්සු රු. 5000 ක දීමනාවක් ඉල්ලන්නේ නැතුවයි දුන්නේ. ඒ බව ඔබතුමාත් මමත් දන්නවා. කොරෝනා වසංගතයෙන් මිනිස්සු 200 ක් මැරෙනකොට රට වැහුවා. මැතිවරණ කල් දැම්මා. රටේ මිනිස්සු ගැන බලන්නේ නැතුව රටේ ආර්ථිකය ගැන බලන්නේ නැතුව 2/3 බලය ලබා ගැනීමට මේ ආණ්ඩුව කටයුතු කලා. මුදල් කළමනාකරණය පිළිබඳ විධිමත් වැඩපිළිවෙලක් නොමැති වීම නිසා රට අරාජික වෙලා. පසුගිය ආණ්ඩුව කාලෙත් ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලෙත් විවිධ අවස්ථාවල් වලදී ජනතාව උද්සෝෂණ කරනවා. පඩි වැඩි කරගන්න උද්සෝෂණ කරනවා. ඒවට කන් දෙන්න ඕන. රජයක් ලෙස සියලු පුරවැසියන් ආරක්ෂා කරගෙන කටයුතු කරන්නත් ඕන. ආණ්ඩුවක් විදිහට සහන සලසන්න ඕන. ඒත් අතේ තියෙන ඔක්කොම දුන්නොත් මොකද වෙන්නේ? අද ඒ තත්ත්වයට රට වැටිලා ඉන්නේ? කොතනද නවතින්නේ කියන තත්ත්වය තමයි මේ උදා වෙලා තියෙන්නේ? බැසිල් මැතිතුමා ලංකාවට ආවා. එතුමාට මුදල් ඇමැති වෙන්න ඕන වුණ නිසා එම අමාත්‍යධූරය හිමිවුණා. ඉන්පසුව එතුමාට ජනාධිපති වෙන්න ආසාවේ ද කොහෙද මසක් ඇතුළත මේ සිදුවීම් සියල්ල සිදු වුණා. එතුමා ඇමරිකන් පුරවැසියෙක් බව කාටවත් නෑ කියන්න බෑ. 20 වැනි සංශෝධනය මඟින් ද්විත්ව පුරවැසිභාවය හිමි පුද්ගලයන්ට අපේ රටේ ඡන්දය ඉල්ලන්න අවස්ථාව උදා කරමින් ඒ අයිතිය සකස් කලා. මිනිසුන්ට සහනයක් නෑ. බැසිල් ඇමතිතුමා රුපියල කුජීත කරලා ලොකේ තියෙන පහළම තැනට රුපියලේ අගය දැම්මා. එයට එතුමා වගකියන්න ඕන. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා තම සහෝදර පවුල සමඟ එකමුතු වී රට පාලනය කලා. බෞද්ධයෝ සියලු කැපකිරීම් මැද ඡන්දය ප්‍රකාශකර 2/3 ක් සහිත ආණ්ඩු බලය ලබාදුන්නා. රුවන්වැලි මහ සෑ අභිරදුන් අභියස දී ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ ජනාධිපතිවරයා ලෙස දිවුරුන් දුන් අවස්ථාවේ දී තමන් ජයග්‍රහනය කලේ සිංහල බෞද්ධ ඡන්දයෙන් බව ප්‍රකාශ කලා. රසායනික පොහොර ඉවත්කර කාබනික පොහොර ගෙන්වීමට ක්‍රියාකිරීම මේ සියලුම ගැටලු වලට හේතුවයි. කොහෙවත් මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක වුණේ නැහැ. රසායනික පොහොර ඉවත්කර කොම්පෝස්ට් පොහොර ලබාදෙන බව ප්‍රකාශ කලත් ගම්වලට එක් රජයේ නිලධාරියෙක් ඒ ගැන සොයා බලන්න ආවේ නැහැ. රජයේ නිලධාරින් ඒ සඳහා නිවැරදි උපදෙස් ලබා දුන්නේ නැහැ. කොට්ඨාසය තුල කාබනික පොහොර නිෂ්පාදන කටයුතු පිළිබඳ කමිටු රැස්වීම් පවත්වන ලෙසට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී දැනුවත් කලත් ඒවා ක්‍රියාත්මක වුණේ නැහැ. රජයේ නිලධාරින් මෙහෙය වීමට ආණ්ඩුවට බැරි වුණා. එමඟින් ජනතාවට ප්‍රශ්න උද්ගත වුණා. මහජන නියෝජිතවරු කමිටු නියෝජනය කර ජනතාවට පවතින ප්‍රශ්න සාකච්ඡා කරනවාට බිය නිසා ප්‍රශ්න හංගලා රජයේ නිලධාරින් බේරෙන්න උත්සාහ කරනවා. එවැනි තැන්වලට අපිට බලෙන් යන්න සිදු වෙලා. රජයේ වැඩසටහන් වලදී ජනතාව අතරට යාමට ජනතාව එක්රැස්වන තැන පිළිබඳව, ඒ යෝජනා පිළිබඳව ගරු සභාපතිතුමාව සහ කොට්ඨාසභාර මන්ත්‍රීවරන් දැනුවත් කරන්න ඕන.
රජයේ නිලධාරින් දුප්පත් මනුස්සයා හිරකරගෙන ඉන්නවා. ප්‍රශ්න කතා කරන්න දෙන්නේ නැහැ. මෙම රජය බලයට පැමිණීමෙන් පසුව බැදුම්කර සිද්ධිය මුල්කරගත් හොරු ඇල්ලුවේ නැහැ. මාත් සමඟ කතෝලික මන්ත්‍රීවරු තිදෙනෙක් මේ සභාවේ ඉන්නවා. පාස්කු ප්‍රහාරය එතුමා කලා කියන්නේ නැහැ. ඒත් එතුමාට ජන වරම ලැබුණේ රුධිරය මතින්. කතෝලික ප්‍රජාවගෙන් 90% ක් ඡන්දය දුන්නේ වර්තමාන ජනාධිපතිතුමාට. එමෙන්ම කාදිනල්තුමා ඡන්දය දුන්නේ මෙතුමාට බව ප්‍රසිද්ධියේ කියනවා. කාදිනල්තුමාටවත් කතෝලික අයටවත් උදව් නොකල නිසා ඒ සඳහා එතුමාට ජත්‍යාන්තරයට යන්න වුණා. කතෝලික කාදිනල්තුමන්ලා අතර බෙදීම් ඇති කරලා ගැටලු සහගත තත්ත්වයක් ඇති කරන්න හැදුවා. සැලුණේ නෑ. දෙවියෝ උඩ ඉන්නවා. මේ තත්ත්වය දේව ශාපයක් වගේ දැනෙනවා. කරන කරන හැමදේම අසමත්. වර්තමාන ජනාධිපතිවරයා එක දෙයක් කරා කියලා මම කියනවා. එනම් මේ රටේ අධිකරණය විසින් වරදකරුවන් කරන පුද්ගලයන් එකුමා විසින් නිදොස්කොට නිදහස් කරන්න පත් වූ ජනාධිපතිවරයෙක් පමණමයි යනුවෙන්.

(ix). ප්‍රාදේශීය සභා මන්ත්‍රී, අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා අදහස් දක්වමින්,

වත්මන් ආර්ථික අර්බුධය හේතුවෙන් ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වතු ආශ්‍රිතව වැඩ කරන ජනතාව පීඩනයට පත්ව සිටිනවා. ඔවුන්ට ස්ථිර වැටුප් නැහැ. වැඩ කරන දිනයට පමණක් වැටුප් ගෙවනවා. වැටුප සීමිතයි. සීමිත කාලයක් තුල අධ්‍යාපනය වැඩි කරගෙන උසස් මට්ටමකට එන්න හැකි වෙලා තිබුණා. එහෙත් මේ දිනවල පවතින ආර්ථික තත්ත්වය නිසාත්, ලැබෙන වැටුප ප්‍රමාණවත් නොවන නිසාත් ළමුන්ට අධ්‍යාපනය අතරමඟ නවතා දමා ආදායම් වැඩි කරගන්න කොළඹ ප්‍රදේශයේ රැකියා වලට යන්න සිදු වෙලා. මේ ආණ්ඩුව විසින් ඉතා ඉක්මණින් තීන්දු තීරණ වලට එන්න ඕන. රු. 80.00 ක් ගෙවා මිලදීගත් සහල් කිලෝව අද රු. 200.00 ට ගන්න වීම විශාල අර්බුධයක්. වතුකරයේ ජනතාවගෙන් ඉතා සුළු පිරිසක් පමණයි උගත්කමින් ඉදිරියට පැමිණ සිටින්නේ. ආණ්ඩුවට විරෝධය ප්‍රකාශ කරනවා.

(x). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
මේ රටේ තියෙන්නේ අදෝනාවක්. මේ රට අදෝනා හඬ නගන්න ඕන රටක් නෙවෙයි. 1948 සිට මේ දක්වා පාලන තන්ත්‍රය විසින් රටට කල හානිය නිසා අද අපි විපාක විඳිනවා. ලංකාව ලෝක සිතියමේ ඉතා වටිනා තැනක පිහිටා තිබෙනවා. ශ්‍රී ලංකාව වටේට මහ මුහුද පිහිටලා තියෙනවා. මේ රට පහත රටත්, උඩ රටත් වශයෙන් ද ගංගා 23 ක් පමණ ගලා බසින රටක්. ලොව ඇති සියලුම දේශගුණයන් මෙහි පවතිනවා. වැව් 35000 ක් පමණ තිබෙනවා. සතා සිව්පාවා, ගහකොළ සියල්ලෙන් අංග සම්පූර්ණයි. මිනිස් ප්‍රජාව දියුණුයි. රට වටේම මහ මුහුද පිහිටා තිබුණත් අපි පිට රටින් හාල්මැස්සෝ මිලට ගන්නවා. හොඳම වතුර තියෙන රටක් නිසා ලංකාව අංග සම්පූර්ණයි. මහපොළවේ මැණික් සහ තෙලුත් පිහිටලා තිබුණත් අනුන්ගේ රටවලින් හිඟා කනවා. ඇරෙන්න මුහුදෙන් සහ පොළවෙන් වැඩක් ප්‍රයෝජන ගෙන නැහැ. මෙතෙක් පැවැති ආණ්ඩු කිසිම දෙයකින් ප්‍රයෝජන ගෙන නැහැ. සෑම ආණ්ඩුවක් විසින්ම එකිනෙකාට දෝෂාරෝපණ එල්ල කර ගන්නා අතර ඊට හේතුව වන්නේ අදක්ෂ පාලනයයි. ණය ලබාගත්තත් පොළවෙන් ගංගාවලින් වැඩක් ගත්තේ නැහැ. බෝතලේ වලව් පරපුර, හොරගොල්ල බණ්ඩාරණායක පරපුර, සිට මහින්ද පරපුර දක්වා කාලය තුල පවුල් පාලන තන්ත්‍රයක් බිහිවුණා. ඒ බව දැන සිටි නිසා 1910 දී ඉංග්‍රීසි ආණ්ඩුකාරවරු ලංකිකයන්ට සර්වජන ඡන්ද බලය ලබා නොදෙන ලෙස ප්‍රකාශ කර තිබුණා. මේ රටතුල මැරෙන්නවත් නොහැකිව වෙනත් රටකට ගිහිල්ලා මැරෙන්න සිදු වන තත්ත්වයක් අද උදා වෙලා. රටතුල වාර්තා වන සිද්ධි, ප්‍රවෘත්ති අහ හිරි වැටෙනවා. දරුවන්ට කන්න දෙන්න දෙයක් නැති නිසා පියා දිවි නහගෙන යනුවෙන් පෙබරවාරි 03 වෙනිදා ප්‍රවෘත්තියක් පල වෙනවා. ළමයින්ට කන්න දෙන්නේ මොනවාද? එම ප්‍රවෘත්තිය පල වී ටික දිනකින් ජනතාවට ආහාර සහන පැකේජයක් ලබා දෙන බවට ප්‍රවෘත්තික් ඉදිරිපත් වෙනවා. ඒ සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් තිබෙන ආර්ථික අමාත්‍යවරයාට ගරු කරන්න ඕන. ඊට පස්සේ ජනතාව පෝලිම්වල රැඳෙනවා. විදුලි කප්පාදුවත් සිදු වෙනවා.
හිට්ලර්ට උරදුන් ගොබෙල්ස් න්‍යාය හැමදාම කිව්වේ බොරු. හැමදාම මිනිස්සු හූරගෙන කනවා. ලංකාවෙත් අද ඒ තත්ත්වය උදාවෙලා. ඒත් මිනිස්සු වර්තමාන යථාර්ථය තෙරුම් අරගෙන ඉන්නේ. මිනිස්සු වත්මන් අග්‍රාමාත්‍යතුමාව දෙවියන් සේ අදහුවා. කතරගම දේවාලේ වන්දනා කරන්න යනවා වගේ එතුමා බලන්න ගියා. අද ඒ මිනිස්සුන්ම තෝ පල, තෝ පල කිය කියා එළවනවා. පවුල් පාලනයට නතුවෙන්න හොඳ නෑ. අපි සාධාරණ විය යුතුයි. සාධාරණ යුක්තිගරුක සමාජයක් ගොඩනැගීමට අවංක හොරකම් නොකරන දේශපාලනයක් බිහිවිය යුතු අතර ඒ සඳහා අප තුල කැපවීමක් පැවතිය යුතුයි. හොරකම වැඩියි. එනිසා මේ රට ගොඩනගන්න බැරි තත්ත්වයට පත් වෙලා. කවුරුත් හිතට එකඟව රටේ තත්ත්වය දන්නවා එහෙත් කතා කරන්නේ නැහැ. රටක් ලෙස ඉදිරියට යන්න නම් රටට ආදරය කරන පිරිසක් සමග එකතු වී සැබෑ වූ දේ සැබෑ ලෙස තේරුම් අරගෙන මේ රට වෙනස් කිරීමට කටයුතු කරමුයි කියා ඉල්ලා සිටිනවා.

(xi). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය.හස් දක්වමින්,
මේ සභාවේ එක් මන්ත්‍රීවරයෙක් දරන මතය අන් අයත් දරන්න ඕන, ඒ මතයෙම ඉන්න ඕන කියලා නීතියක් නෑ. රට තුල උද්ගතව ඇති තත්ත්වය එක්වරම සිදු වූවක් නොවෙයි. අපේ රටේ දශක තුනක සිට යුද්ධයක් පැවතීම නිසා මේ තත්ත්වයට පත් වුණා. වත්මන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිඳුන්ට එය

නිමා කරන්න හැකි වුණා. එහිදී අතිගරු ජනාධිපති ගෝඨාභය මැතිදුන් විශාල ශක්තියක් ලබා දුන්නා. අතිගරු ජනාධිපති ගෝඨාභය මැතිදුන් කොරෝනා වසංගත තත්ත්වය පාලනය කලා. චීනයතුල මෙම වසංගතය ව්‍යාප්ත වීමේ දී එය අපේ රටතුල ව්‍යාප්ත වීමට පෙර රට බේරා ගැනීමට මැනවින් කළමනාකරණය කිරීමට සැලසුම් සකස් කලා. ජනතාවට ඒවා මතක නැහැ. අතීතයේ සිටම ඩොලර් සංචිත හිඟවීම සිදු වුවත් කොරෝනා වසංගතය සමඟ රට වසා තැබීම හේතුවෙන් විදේශ ශ්‍රමිකයන්ගෙන් ලැබිය යුතු ඩොලර් සංචිත ප්‍රමාණය අවම වුණා. කොරෝනා මර්ධන එන්නත් නොමිලයේ ලැබුණේ ටිකක් ලැබුණත් ඉතිරි සියල්ල ගත්තේ ඩොලර් වැය කරලා. ලංකාවේ සියලුම අයට එන්නත ලබා දුන්නා. පිටරට පදිංචිව සිටි අය නැවත ලංකාවට ගෙන්වා ගන්නා ලෙස ඉල්ලීම් කලා. ඔවුන් ගෙන්වා ගැනීම නිසා ඔවුන්ගෙන් රටට ලැබිය යුතු ඩොලර් ලැබුණේ නැහැ. මේ මට්ටමට හෝ තබා ගැනීමට හැකි වුණේ භාණ්ඩ අපනයනය වැඩි වුණ නිසා ය.

(xii). ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා අදහස් දක්වමින්,
විපක්ෂයේ මන්ත්‍රීවරු වීදි බැහැලා උදඝෝෂණ කරමින් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ඉල්ලා අස්වෙන්න කියනවා. 2015 වසරේ සියලු දෙනා ඒකරාශී වී යහපාලන ආණ්ඩුව ගොඩනැගුවත් එය බිඳවැටෙනවා. 2018 පළාත් පාලන ඡන්දයෙන් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ ජයග්‍රහනය කරනවා. එහිදී යහපාලන ආණ්ඩුවට ගෙදර යන ලෙසට ඉල්ලීම් කලත් ආණ්ඩුව ගෙදර යන්නේ නැහැ. පළාත් පාලන ඡන්දය ජයග්‍රහනය කලාට ආණ්ඩු ගෙදර යන්න අවශ්‍ය නැහැ කිව්වා. ඒ ආණ්ඩුවම පවත්වාගෙන ගියා. 2020 වර්ෂයේ කොරෝනා වසංගතය සමඟ රට තුල ප්‍රශ්න රාශියක් ඇති වුණා. පිටරට ජීවත් වූ මෙරට වැසියන් සහ තම දරුවන් නැවත ලංකාවට ගෙන්වා දෙන ලෙසට ඉල්ලීම් කලා. 1988 සහ 1989 වර්ෂ වලදී ජ.වි.පෙ. විසින් නිවෙස් වලට ගොස් වෙඩි තියලා මිනිස්සු මරා දැම්මා. ට්‍රාන්ස්ෆෝමර් ගිනිතිව්වා. මේ ආණ්ඩුවට ඡන්දය දුන් හැටනම ලක්ෂයම අද මහ පාරේ නැහැ. 2025 වසර දක්වා ආණ්ඩුව පවත්වාගෙන යාමට අවශ්‍ය සහයෝගය අප ලබා දෙනවා. ජනාධිපතිතුමා වැරදියි නම් අපිත් එතුමාට විරෝධය පානවා. හැට නම ලක්ෂයක ඡන්දයකින් දිනලා තමයි එතුමා ජනාධිපති වුණේ. බලෙන් ඇවිත් වාඩි වුණේ නැහැ. වත්මන් අග්‍රාමාත්‍ය මහින්ද මැතිතුමා හොඳ නැහැ කියලා හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඡන්දය දුන්නා. විපක්ෂ නායක සංජිත් මැතිතුමා හොඳ නැහැ කියලා අතිගරු ජනාධිපති ගෝඨාභය මැතිතුමාට ඡන්දය දුන්නා. විපක්ෂ නායක සජිත් මැතිතුමා පැරදුණා. ඒ අනුව එක් එක් කාල වකවානුවලදී යම් යම් අඩුපාඩු සිදු වෙනවා. අද මේ ආණ්ඩුව ඉවත් වුණොත් ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්න වෙනවා. තම ධූර වලින් ඉල්ලා අස් වෙන්න කිව්වාට, කවුද ඊළඟට ආණ්ඩුවේ පාලනය ගෙනියන්නේ. එලෙස ආණ්ඩු පිහිටුවන්න බැහැ. යහපාලන ආණ්ඩුව කාලෙත් ඉන්ධන හිඟ වුණා. ආණ්ඩුව 100% ක් නිවැරදි නැතුව ඇති. පවතින වැරදි නිවැරදි කරගෙන ඉදිරියට රට මෙහෙයවමු. ප්‍රශ්නයක් ආවම අද පත්වෙලා ඉන්න ආණ්ඩුවට ඉවත් වෙලා ගෙදර යන්න කියනවා. අනතුරුව හෙටත් ආණ්ඩුවක් පත් වෙනවා. එයත් අස්ථාවර වෙනවා. එවිට ස්ථාවර ආණ්ඩුවක් පවත්වාගෙන යන්නේ කවුද? ආණ්ඩුවට ඉවත් වෙන ලෙසට ඉල්ලුම් කලාටම ආණ්ඩුවක් දාලා යන්නවත්, ආණ්ඩු බලයට එන්නවත්, ආණ්ඩු පිහුටවන්නවත් බැහැ. මෙවැනි ප්‍රශ්න ඉතිහාසය තුලත් සිදු වෙලා තියෙනවා. ආණ්ඩුව යහපත් තැනකට ගේන්න උත්සහ කරමු. ආණ්ඩුව අතරමගදි දාලා යන්න ලැස්ති නැහැ.

(xiii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා අදහස් දක්වමින්,
ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලය විසින් ලබා දුන් කුඩා භූමියක පඹහින්න මංසන්ධිය අසල පොදු වැසිකිළිය ස්ථාපිතව පවතිනවා. එහි ගලිවල ඉතා කෙටි කලකින් උතුරායනවා. අවස්ථාවන් කිහිපයකදී කොට්ඨාසය නියෝජනය කරන මන්ත්‍රීවරයා ලෙස මාගේ ඉල්ලීම පරිදි ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලය විසින් ගලිවල පිරිසිදු කිරීමට දායකත්වය ලබා දුන්නා. මෙම ගලිවල ගැඹුරු කොට නැවත සංවර්ධනය කිරීමට සභාවට යෝජනාවක් ඉදිරිපත් කලා. දීර්ඝ කාලයක සිට මා ඒ බව සභාවේ කාර්මික නිලධාරි මහතාට සිහිපත් කලා. එහෙත් මේ වන තුරු එම යෝජනාව ක්‍රියාත්මක වී නැහැ. මෙම ගලි වල කෙටි කාලයකින් උතුරා යාම නිසා පොදු අවශ්‍යතාවයක් බැවිනුත්, ජනතාව අපහසුතාවයට පත්වන බැවිනුත්

අත්‍යාවශ්‍ය හදිසි කටයුත්තක් සේ සලකා මෙම ගලිවල ධාරිතාවය කර සංවර්ධනය කිරීම සඳහා කඩිනමින් අවශ්‍ය පියවර ගන්න.

(xiv). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා අදහස් දක්වමින්,
මෑත කාලයේ සිදු වූ ප්‍රශ්න හේතුවෙන් වර්තමානය වන විට රට උග්‍ර ආර්ථික අර්බුධයකට මුහුණ දීලා තියෙනවා. එය අපි කවුරුත් පිළි ගන්නවා. මීට වඩා ධනවත් රටවල්වලට පවා මෙම ප්‍රශ්න වලට මුහුණ දෙන්න වුණා. අතිගරු ගෝඨාභය මැතිතුමා ආණ්ඩු බලය ලබා ගන්නා අවස්ථාවේ දී මේ රට සංවර්ධනය කිරීමට, රට ගොඩනැගීමට එතුමා තුල ලොකු වැඩ පිළිවෙලක් තිබුණා. එහෙත් කොරෝනා වසංගතය පැතිරෙන්න පටන් ගත්තා. සියල්ල මැඩපවත්වාගෙන සිංහල අලුත් අවුරුද්ද සඳහා රු. 5000 දීමනාව ලබා දුන්නා. මන්ත්‍රීවරුන් කමිටු පවත්වමින් ඒ සඳහා මැදිහත් වුණා. එමනිසා අපි කෙළෙහි ගුණ නොදන්න ජාතියක් නොවිය යුතුයි. කොරෝනා වසංගතය සමඟ ආර්ථිකය කඩා වැටුණා. ඒත් ඒ කඩා වැටීම නිසාම චෝදනා කිරීම වැරදියි. ජ.වි.පෙ. මන්ත්‍රීතුමා සභා ගර්භයෙන් පිටව ගොස් නිසා අපේ අදහස් ඇසීමට එතුමාට අවස්ථාවක් නැහැ. එතුමා මෙහි සිටියානම් හොඳයි. ජනතාව වීදි බැහැලා සාමකාමී ලෙස කිරිපිටි ලබා ගැනීමට, ගෑස් ලබා ගැනීමට, ඉන්ධන ලබා ගැනීමට උද්ඝෝෂණ වල නිරත වුණා. එහෙත් සමහර පක්ෂ විසින් මේ ජනතාවගේ කොන්දේ එල්ලිලා එම සාමකාමී උද්ඝෝෂණ අරගල කරා ගෙන යාමට උත්සාහ කළා. බස්වලට ගිනි තියලා, ගල් ගහලා රාජ්‍ය දේපල විනාශ කරලා රට ප්‍රචණ්ඩත්වයක් කරා ගෙන ගියා. එම උද්ඝෝෂණය අවස්ථාවේ දී ජ.වි.පෙ. පක්ෂ නායකතුමාගේ වාහනයට යම් පුද්ගලයෙක් ඇතුල්වන බව අපි මාධ්‍ය තුලින් දුටුවා. නෑ කියන්න බැහැ. එම උද්ඝෝෂණයෙදි ජනතාව මෙහෙයවූයේ කවුද? භායානක භීෂණ කාලයක් කියලා ජ.වි.පෙ. මන්ත්‍රීවරු කිව්වා. ඒත් අද විදුලි බලය නොමැතිව වුවද රටේ ජීවත් වෙන්න හැකියාවක් තියෙනවා. විදුලි බලය, ඉන්ධන නොමැතිව අතීත භීෂණ කාලයෙදි මහපාරෙදි මගේ තත්තා මරලා දැම්මා. ඒ යුගයේ දණහිසෙන් උඩටට මිණී පෙට්ටියක් උස්සන්න දුන්නේ නහැ. මට අත්දැකීම් නොමැති වුවත් මගේ පියා මහපාරේ මරා දැමීමේ අත්දැකීම සහ වේදනාව මට අදටත් තියෙනවා. මහ ඉහළින් ප්‍රජාතන්ත්‍රවාදය කතා කලාට රජයේ දේපල විනාශ කලා. මගේ පියා මට නැවත ලබා ගන්න පුළුවන්ද? එවැනි යුගයක් නැවත ලංකාවට එන්නේ නැහැ. ඒත් එවැනි යුගයකට ඇදලා දාන්න බලනවා. අහිංසක මිනිස්සු උසි ගන්වලා ඒ මතින් රටේ දේශපාලන බලය ගන්න උත්සාහ කරනවා. මේවා කවදාවත් ක්‍රියාත්මක වන්නේ නැහැ. එවැනි යුගයක් යළි ස්ථාපිත නොවේවා කියා ප්‍රාර්ථනා කරනවා. ඔබතුමන්ලා මහ ලොකුවට කියනවා ආණ්ඩුව භාර දීලා ගෙදර යන්න කියලා. ආණ්ඩුව පාලනය කරන්න කෙනෙක් ඉන්න ඕන. ඊට පස්සේ ආණ්ඩුව භාරගෙන කටයුතු කරන්නේ කවුද? ඔබතුමන්ලා භාරගන්නකෝ. අපි හැමදාමත් සාධාරණ විසඳුම් ඉල්ලා සිටියා. ඔබතුමන්ලාත් සහයෝගය ලබා දෙන්න. මේ අවස්ථාවේදි හදිසි මැතිවරණයකට යන්න අවශය නැහැ. 1977 වර්ෂයේ සිට පැවත එන ණය ශේෂයක් පවතින්නේ. එදා සිට මේ දක්වා සිටි පාලකවරු මේ තත්ත්වයට වග කියන්න ඕන. මැතිවරණයකට ගියොත් නැවත තේරී පත් වන්න බැරි බව පාර්ලිමේන්තු මන්ත්‍රී දයාසිරි ජයසේකර මැතිතුමා ප්‍රකාශ කලා. ජනතාව පාර්ලිමේන්තුවේ 225 ම එපා කියලා කියන බව එතුමා ප්‍රකාශ කලා. ඒ නිසා බල තණ්හාවෙන්, පටු අරමුණු මතින් බලය බෙදා ගතයුතු කාලයක් නොවෙයි. මැතිවරණ පවත්වා රටේ පවතින මුදලත් නාස්ති කල යුතු යුගයක් නොවෙයි. සභාවෙදි අදහස් ඉදිරිපත් කරනවා සේම පක්ෂ නායකයන්ට එම අදහස් ඉදිරිපත් කරන්න. ආර්ථික දේශපාලන ගැටලු විසඳා අනතුරුව මැතිවරණයකට යමු.

(xv). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
අද විපක්ෂයේ තේමා පාඨය වන්නේ ගෝඨා ගෝ හෝම් කියන එකයි. ජනතාවට තියෙන්නේ ගෝඨාභය කියන බය කියලා මට හිතෙනවා. මෙහි සම්පූර්ණ වගකීම එතුමා භාර යුතු නම්, අපිත් එහි කොටස්කරුවන් වෙමු. මගේ වසර 40 ක ජීවිත කාලය තුල අත්දැකීම් අනුව 1977 වසරෙන් පසුව කූපන් පොත කියලා කාඩ් පත්‍රයක් මඟින් ජනතාවට සහන සලසා දුන්නා. සෑම පක්ෂයක්ම බලය ලබා ගැනීමට, බලය තහවුරු කිරීම

සඳහා එක් එක් කොටස් එකතු කරමින් ජනතාවට සහන ලබා දුන්නා. තමන් විසින් නිෂ්පාදනය කරගෙන කන්න හුරු කලේ නැහැ. එම ආර්ථික පෙරළියේ ප්‍රතිඵල දැන් අත් විදිමට සිදුව තියෙනවා. පරිභෝජනයට ආහාර, ඉන්ධන, විදුලිය නැති බවට මන්ත්‍රීවරු අදහස් දැක්වූවා. අතිගරු ජනාධිපති ගෝඨාභය මැතිතුමා ගමකට එක් නිවසක් යන සංකල්පය යටතේ නිවාස ඉදිකර දීමේ දී හෝ රු. 5000 දීමනාව ලබා දීමේ දී එම මුදල් එපා ඒවා යොදා රට සංවර්ධනය කරන්න කියලා කවුරුත් කිව්වේ නැහැ. කොරෝනා මර්ධන එන්නත් ලක්ෂ විසිපහක් චීනෙන් ලබා දුන්නත්, ඉතිරි සියල්ල මිලදී ගත්තේ ඩොලර් වියදම් කරලා. සෑම පක්ෂයක් විසින් ම ආණ්ඩු බලය ලබා ගැනීමේ දී සහන ලබාදෙන පොරොන්දුව දුන්නා. පාන් ගෙඩිය රු. 3.50 ට දෙනවා කිව්වම ආණ්ඩු පත්කල කාලයක් තිබුණා. අප රට හැරවුම් ලක්ෂයකට පැමිණ තිබෙනවා. සියලුම සහනාධාර නතර කර අපේ රට ආර්ථික වශයෙන් ස්ථාවර කර ගන්න පුළුවන්. උමාඔය ව්‍යාපෘතිය අවස්ථාවේ දී එමගින් ලබා ගන්නා ජලය හම්බන්තොටින් නැව් වලට බෙදා හරින්න පුළුවන් කියලා කව්රුත් කිව්වේ නැහැ. අපිට රු. 5000 දෙන්නේ ඇයි කියලා කවුරුත් ඇහුවේ නැහැ. කාගෙත් කටට ශරීරයට පණ තියෙන්නේ කොරෝනා එන්නත් ලබා දුන් නිසයි. පවුල් පාලනයක් නොව එතුමා ජනතා ඡන්දයෙන් බලය ලබා ගත්තා. ජ.වි.පෙ. මන්ත්‍රීවරයා මේ අවසථාවේ සභා ගර්භය තුල නැහැ. මීට වඩා හොඳ පවුල් පාලන බලයන් පිළිබඳව කතා කල හැකියි. පුංචි අම්මාගේ දේ පිට යයි කියන බයට, පුතා විසින් පුංචි අම්මාව සහයට ගත්තා. එය තමයි නියම පවුල් පාලනය. ජනතාවගේ අතපය හතර තිබෙන නිසා ස්වශක්තියෙන් නැගී සිටින රටක් සකස් කල යුතුයි. නිවාස ඉදිකරන්න තහඩු ලබා දීලා වැසිකිළි ඉදි කරන්න වැසිකිළි පොච්චි ලබා දීලා රටේ ආර්ථිකය ගොඩනගන්න බැහැ. පක්ෂ මන්ත්‍රීවරුන්ගෙත් විපක්ෂ මන්ත්‍රීවරුන්ගෙත් රටේ ජනතාවගෙත්, ගලාගෙන එන සියලු යෝජනා සහ අදහස් ලබාගෙන හැකියාවෙන් ප්‍රයෝජන ගනිමින් සවිමත් ආර්ථිකයක් ගොඩනැගීම සඳහා ඉහළ දේශපාලනය දැනුවත් කිරීමට කටයුතු කරමු. රටේ ප්‍රශ්න තිබුණත් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ නාම පුවරුවේ කඩාකප්පල්කරුවෙක් හෝ උද්ඝෝෂණ කරුවෙක් විසින් ගෝටා ගෝ හෝම් කියලා ලියා තබා රාජ්‍ය දේපලවලට හානි කරලා. ඊටත් වඩා දේපල හානියක් සිදු විය හැකි බැවින් ඒ පිළිබඳව ආරක්ෂක නිලධරින් දැනුවත් කරන්න.

(XVI). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
මෙරට 2008, 2011,2012 යන වර්ෂ වලදී අපි වවමු රට නගමු යන වැඩසටහන් වලදී බීජ වර්ග ලබා දුන්නත් එක් පැකැට්ටුවක බීජ 10 ක් තිබුණු අතර, බීජ බහාලුම් කවරය සඳහා රු. 20.00 ක් වියදම් කරලා තිබුණා. එවැනි අනවශ්‍ය වියදම් රටතුල සිදුවුණා. කොරෝනා එන්නත් සඳහා ඩොලර් වියදම් වුණා තමයි එහෙත් මෙරට පැවැති තිස්වසරක යුද්ධයේදී මීට වඩා විනාඩියට කෝටි ගණනක් ඩොලර් වියදම් වුණා. 2001 වර්ෂයේ දී ජලය නොමැතිවීම නිසා විදුලිය කපා හැරීමට සිදු වුණා. ඒ කාලවකවානුවෙදි විෂය භාර අමාත්‍යවරයාට කරුවල ජයසූරිය නමින් නමකුත් පට බැඳුනා. එම ආණ්ඩුව වසර 2 ½ න් අවසන් වුණා. යහපාලන ආණ්ඩුව කාලයේදීත් ඉන්ධන මිල ඉහළ ගියා. ඒත් අපි දැකපු කාලේ සිට මේ වගේ පෝලිම් දක්නට ලැබුණේ නැහැ. ආණ්ඩු බලය අපට භාර ගන්න කියනවානේ අපි භාර ගන්නම් ඒත් ඊට පෙර 20 වන සංශෝධනය නැමැති කුණු ගොඩ ඉවත් කරන්න. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂයටයි වැඩි බලය තියෙන්නේ ඒ නිසා 19 වන සංශෝධනය බලාත්මක කරන්න කියන්න. අපි භාර ගන්නම් උඩ ඉඳගෙන ටොකු අනිනවා වගේ. ක්‍රියාත්මක කරන්න බැහැ. මේ ආණ්ඩුව ලේ වැගිරීම් වලින් බලය ලබා ගත්තා තමයි.
පුරන් වූ කුඹුරු යළි අස්වැද්දීම පිළිබඳව රත්මලවින්න ගොවිජන සේවා සංවර්ධන නිලධාරිතුමාත් කු.ප.නි.ස. විසින් සොයා බලා අවශ්‍ය කටයුතු කිරිමට පියවර ගෙන තිබෙනවා. ඒ පිළිබඳව ගොවිජන සේවා සංවර්ධන නිලධාරිතුමාත් කු.ප.නි.ස. ට ස්තුතිය පල කිරීමට මෙය අවස්ථාවක කර ගන්නවා.

(XVII). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දක්වමින්,
පිඩලිගන්නාවෙල කෝට්ටෙයාකන්ද මැදහින්න මාර්ග සංවර්ධන කටයුතු අතරමග නවතා දමා තිබෙනවා. එම මාර්ග සංවර්ධන කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගන්න.

නෙල්ලිවල සිට හෙලවත්ත පස්සරමුල්ල දක්වා මාර්ග සංවර්ධන කටයුතු සඳහා ලෝක බැංකු ආධාර යටතේ ප්‍රතිපාදන වෙන්කර තිබෙනවා. ඒ පිළිබඳව සතුටට පත් වන අතරම ප්‍රශංසා කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.
වර්තමානයේදී රට ආර්ථික වශයෙන් දුෂ්කරතාවයන්ට පත්ව ඇති බව අවිවාදයෙන් යුතුව පිළි ගන්නවා. ඒ අතරතුර කාලවකවානුව තුල අතීතයට ගමන් කිරීමේ දී 1965 එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතානන් බලයට පැමිණි අවස්ථාවේ දී පාලන තන්ත්‍රයේ විශාල වර්ජන රැල්ලක් ඇති වී එය වසර 03 ක කාලයක් පැවතුණා. ඉන් අනතුරුව, 1970 වසරේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ කාලයේ ජනතා ඡන්දයෙන් 2/3 බලය සහිත ආණ්ඩුවක් පිහිටෙව්වා. රට තුලින්ම නිෂ්පාදන ආර්ථිකයක් ඇති කරන්න එතුමිය උත්සාහ කලා. එම ආණ්ඩුවට 1971 අප්‍රේල් මාසය වන විට විරෝධතා එල්ල වුණා. ජ.වි.පෙ. අදූරදර්ශී ආකාරයට උසාවි, පොලිසි, රාජ්‍ය හා පොදු දේපල විනාශ කලා. රජය පවත්වගෙන යාමේදී දුෂ්කරතා මතු වූ අතර 1977 වසරෙදි ආසන 08 දක්වා අඩු වෙලා ජේ.ආර්. මැතිතුමා 5/6 ක බලයකින් යුතුව පාලන කටයුතු ආරම්භ කලා. එම කාලය තුල දී රටට අවශ්‍ය භාණ්ඩ ආනයනය කරන්න පටන් ගත්තා. විධායක ජනාධිපති තනතුර ස්ථාපිත කලා. 1980 ජූලි වැඩ වර්ජනයෙන් පසුව විශාල වශයෙන් සේවකයන් සේවයෙන් පහ කලා. 1988 සහ 1989 වර්ෂවල රට තුල භීෂණ කාලයක් උද්ගත වුණේ ජ.වි.පෙ. ගෙන ගිය ක්‍රියා කලාපයත්, ආණ්ඩුවේ මැර හමුදාවත් නිසා බව ජනතාව දන්නවා. එම කාලය තුල හැට දහසක තරුණයන් මරා දැමුවා. එදා සිට පැවත එන 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තවම වෙනස් වෙලා නැහැ. සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ පවතින මෙම ඡන්ද ක්‍රමය තවමත් වෙනස් කරන්න බැරි වෙලා තියෙනවා. අනතුරුව, මහ මැතිවරණයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ බලයට පැමිණියා. අපිත් එම ජයග්‍රහනයට එක් වූ පිරිසක්. ඒත් සමඟම කොරෝනා ව්‍යසනය පැමිණියා. 2015 සිට 2019 දක්වා ආණ්ඩු කාලය තුල මෙරට විශාල ගැටලු උද්ගත වුණා. ජනාධිපතිතුමාට ගෝ හෝම් කිව්වත් අපි එහෙම කියන්නේ නෑ. මේවා මෙහෙය වන්නේ කවුද? මේ පිටුපස ඉන්නේ කවුද? ටියුෂන් ගුරුවරු පවා මේ පිටුපස සිටින බව ජනමාධ්‍යතුලින් සමාජ මාධ්‍යතුලින් දකිනවා. ජනාධිපති ධූරයත්, ව්‍යවස්ථාධායකයත් වෙනස් කරන ආකාරයක් තියෙනවා. ගැනියෙක් පිරිමියෙක් කරන්නත්, පිරිමියෙක් ගැහැනියෙක් පමණක් කල නොහැකි ආකාරයේ භයානක බලතල විධායකය සතුව පවතිනවා. වර්තමානයේ දී රට මුහුණ පා ඇති මේ තත්ත්වයට සියලු දෙනා වගකිව බැවින් සියලු දෙනා රට ආරක්ෂා කිරීමට කටයුතු කල යුතුයි. කුමන්ත්‍රණ නොමැති අපරාධ නොමැති සාධාරණ උද්ඝෝෂණ සහ විරෝධතා වලට අපිත් ඉන්නවා. ගොවි ජනතාවට සහයෝගය ලබා දී ආර්ථිකය ගොඩනගන්න ජන ජීවිත ආරක්ෂා කරන ලෙසට රජයෙන් ඉල්ලා සිටිනවා. ඩීසල් බැරල් වශයෙන් මිලදීගෙන ගබඩා කරගනිමින් අනතුරුව, වැඩි මිලට විකුණනවා. වාහන වලට පමණක් නිකුත් කල යුතුයි. ඒ පිළිබඳව සොයා බැලිය යුතුයි.

(XVIII). නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරිම,
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අසනීප වී ඇති බැවින් අද දින මාසික මහ සභාවට නොපැමිණෙන බව දැනුම් දෙමින් එතුමන්ගේ නිවාඩු අනුමත කිරීමට චමින්ද ප්‍රසාද් මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.
ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමාගේ නිවාඩු අනුමත කිරිමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,

ගරු ප්රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වීම අනුව,
කැපොක්වත්ත කසල අංගනයයේ පැති බැම්ම ඉදිකිරිම් සම්බන්ධයෙන් ඔබතුමා අදහස් දක්වමින් ඒ සඳහා සිටින සේවකයින් ප්‍රමාණවත් නොවන බව, කසල කළමනාකරණය සඳහා යන්ත්‍ර සූත්‍ර නොමැතිබව,

පොහොර සකස් කිරිම සඳහා පවතින කසල විනාශවන බව පැතිබැම්මේ ඉදි කිරීම් ප්‍රමිතියෙන් තොර බැවින් ඒ සඳහා විරෝධතා දක්වමින් අධීක්ෂණ තනතුරෙන් ඉල්ලා අස්වන බව ප්‍රකාශ කළා.

අපි විසින් කල යුතු කාර්ය අප හඳුනා නොගැනීම වරදක්. සංවර්ධනය කරන ලද මාර්ග ඒ.ඞී මහතා විසින් පරීක්ෂා කර ඇති බවත් ඒවා අසමත් වී ඇති බවත් ඔබතුමා ප්‍රකාශ කලා. ඉදිකිරීම් පිළිබඳව තාක්ෂණය පිළිබඳව සොයා බලන්නේ කාර්මික නිලධාරි මහතා පරීක්ෂා කරන අතර එතුමා ලවා වාර්තාවක් කැඳවීමට කටයුතු කරනවා. එම වාර්තාව අනුව පමණක් ගෙවීම් කිරීමට මා කටයුතු කරනවා. ඔබතුමා පරිසරයට ආදරය කරන්නෙක් ලෙස හඳුනාගත් නිසා කසල කළමනාකරණය මධ්‍යස්ථානයේ අධීක්ෂණ මන්ත්‍රීවරයා ලෙස පත්කලා. එහිදී කාබනික පොහොර නිෂ්පාදනය වැඩි දියුණු කිරිම පිළබඳව අවශ්‍ය සහයෝගය ලබා දෙනු ඇතැයි මා බලාපොරොත්තු වුණා. සභාවේ දැනට සිටින ස්ථිර සේවකයන් ප්‍රමාණය අඩුයි. සිටින සේවකයන් ජල ව්‍යාපෘති සඳහාත්, ඩෙංගු වැඩසටහන් සඳහා යෙදවීමට සිදු වෙනවා. අලුතෙන් බඳවා ගැනීමට පුරප්පාඩු තනතුරු නැහැ. සභාවේ අනුමත කාර්ය මණ්ඩලයට අවශ්‍ය වන සේවකයන් බඳවාගෙන තිබෙන බැවින්, අවශ්‍යතාවය සලකා බලා කාර්ය මණ්ඩලය වැඩි කර දෙන ලෙසට ඉල්ලීම් කර තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමන්ලා නොදැනීම පිළිබඳව මාගේ කණගාටුව ප්‍රකාශ කරනවා. ඔබතුමා අධීක්ෂණ මන්ත්‍රීවරයා ලෙස හණ පැළ තවානක් සකස් කිරීමට යෝජනාවක් ඉදිරිපත් කලා. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා දීමට මා කටයුතු කලා. එහි ප්‍රගතිය කෙසේද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
බලංගොඩ වෙළඳසැල්වල පොලිතින් මලු තිබුණනේ නැහැ. එම නිසා කුරිය සර්විස් තුලින් පොලිතින් මලු ගෙන්වාගැනීමට කටයුතු කලා. ඒ සඳහා අවශ්‍ය වන මුදල් ලබා ගැනීමට අදාල විෂය නිලධාරි නිවාඩු ලබා සිටි නිසා යම් ප්‍රමාදයක් සිදු වුණා.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයට මා පැමිණෙන අවස්ථාව වනවිට කැපොක්වත්ත කසල කළමනාකරණ මධ්‍යස්ථානය වළක් ආකාරයට ස්ථාපිතව තිබුණා. එක්රැස්කරණ කසල එම වළට කසල ඒකරාශී කළා. එහෙත් වර්තමානය වන විට නිෂ්පාදන ධාරිතාවය වැඩවන අයුරින් කසල අංගනය පුළුල්ව සංවර්ධනය කර තිබෙනවා. එමඟින් සංවර්ධන කටයුතු පහසුවෙන් පවත්වාගෙන යාමට හැකියාව ලැබී තිබෙනවා. එහි නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරිමට ගොඩනැගිලි පහසුකම් සංවර්ධනය කළ අතර එම ගොඩනැගිලි තව දුරටත් ක්‍රමයෙන් සංවර්ධනය කිරිමට හැකියාව පවතිනවා. එහි සංවර්ධන කටයුතු සමඟ කසල හැලීමට දුෂ්කරතා මතු වුවද ඉදි කිරීම් කටයුතු අවසන් වීමෙන් පසුව ක්‍රමවත්ව කසල කළමනාකරණ කටයුතු සිදු කරනවා. සභා අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් උපකරණ මිලදී ගැනීමට නොහැකි වුවත් ඉදිරියේ දී සභා අරමුදල් වැඩි දියුණු වූ පසුව අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට කටයුතු කරනවා. කැපොක්වත්ත කසල කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳව ජ.වි.පෙ. මන්ත්‍රීතුමා අදහස් විමසා සිටියා. එහෙත් එතුමා සභා ගර්භයේ නොසිටීම නිසා පිළිතුරු ලබා දීමට හැකියාවක් නැහැ.
කසල අංගනයේ පැතිබැම්ම ඉදිකිරීම් පිළිබඳව කාර්මික නිලධාරිගෙන් වාර්තාවක් කැඳවීමටත් එම වාර්තාවේ නිර්දේශ සලකා බලා ගෙවීම් කිරීමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා අදහස් දක්වීම අනුව,
රැකියා ලක්ෂයේ වැඩපිළිවෙලින් සේවකයන් විසි දෙනෙක් බඳවා ගන්නා ලෙස ඔබතුමා යෝජනා කළා. ඒ අනුව අදාල සේවකයන් සභාවට ලබා දෙන ලෙසට ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් ඉල්ලුම් කළා. එතුමිය විසින් සේවකයන් ලබා දුන්නත් නැවතත් එතුමිය විසින් සභාවට අනුයුක්ත කරන ලද සේවකයන් වෙනත් ස්ථාන වෙත අනුයුක්ත කර තිබෙනවා. දැනට ඔවුන්ගෙන් රියදුරන් දෙදෙනෙක් පමණක් මෙහි රැඳී සිටිනවා. සභාවට සේවකයන් අවශ්‍ය වුවද රඳවා තබා ගැනීමේ හැකියාවක් නැහැ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වීම අනුව,
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමාගේ පෞද්ගලික ඉල්ලීම අනුව කුඩා තේවතු සංවර්ධන නිලධාරිතුමිය පිළිබඳව කුඩා තේවතු සංවර්ධන දිස්ත්‍රික් කළමනාකරු වෙත දන්වා යැවීමට කටයුතු කරනවා.
වර්තමානය වන විට පොහොර සහනාධාරය නොලැබීම, පාසැල් දරුවන්ට පෙළ පොත් හිඟ වීම ආදියෙන් ජනතාව ආර්ථික වශයෙන් පීඩාවට පත්ව සිටින බව පිළිගන්නවා. මේ සඳහා දේශපාලනමය විසඳුම වන්නේ අතිගරු ජනාධිපති ගෝඨාභය මැතිතුමා ගෙදර යාම නම් අපිත් එයට කැමැත්ත පල කරන අතර එහෙත් ඒ සඳහා නිසි ක්‍රමවේදයක් තිබෙනවා. ගල් යුගයේ දී මෙන් චණ්ඩි වගේ පාරට බැහැලා ගෙදර යන්න කිව්වට යන්න බැහැ. පක්ෂය පාස්කු ප්‍රහාරය තුලින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ආණ්ඩු බලය ලබා ගත්තේ නැහැ. එම ප්‍රහාරයට පෙර පළාත් පාලන බලය ජයග්‍රහනය කලා. පාර්ලිමේන්තුව තුලවත් කතා නොකරන දේ ප්‍රාදේශීය සභාව තුල කතා කිරීම පිළිබඳව මා කණගාටු වෙනවා. ලේ විලක් මැදින් නොවෙයි මහජන ඡන්දයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය බලයට පැමිණියා. 2018 පෙබරවාරි ජනමතය ලබාගනිමින් බලයට පැමිණි අපේ පක්ෂයත් වර්තමානයේදී ජනතාව පාරට බැහැලා කියනවා වගේ ම එම ආණ්ඩුවට ගෙදර යන්න කිව්වා. ඒත් ආණ්ඩුව ගෙදර ගියේ නැහැ. හේතුව ආණ්ඩු බලය ඉවත් කිරිම සඳහා නීත්‍යානුකුල ක්‍රමවේදයක් පවතින නිසයි. ආණ්ඩුවේ ක්‍රියාකලාපය වැරදි බව අපට හැඟී යන්නේනම් ඊළඟ ඡන්දයෙදි ආණ්ඩුව ගෙදර යවන්න අපිත් උදව් කරනවා.

බලංගොඩ නගරයේ පැවැති ජනතා උදසෝෂණයේ දී සමාජ විරෝධී මත්ද්‍රව්‍ය අලෙවි කරන්නන් පවා සහභාගී වී පෙලපාලි ගිය බව දැනගන්නට ලැබුණා. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ නාම පුවරුවේ ගෝඨා ගෝ හෝම් කියා ලියා තිබෙනවා. එසේ මහජන දේපල වලට හානිකරන්නේ මේ රටට ආදරය කරන අයද? රටට ආදරය කරන්නේනම් ඔවුන් මහජන දේපල සුරැකිමට කටයුතු කල යුතුයි. පාර්ලිමේන්තු අමාත්‍යවරයෙකුගේ නිවස ඉදිරිපිටට ගොස් උද්සෝෂණ කළාට කෑගැහුවට ඔහු බලයෙන් පහ කරන්න බැහැ. ඔහුට බලය ලබා දුන් ආකාරයටම ඔහු බලයෙන් පහකරන නිත්‍යානුකූල ක්‍රමවේදයන් පවතිනවා. මේ සභාව නියෝජනය කරනු ලබන මහජන නියෝජිතවරු විසිපස් දෙනා ගෙදර යන්න කිව්වට යන්න බැහැ. යන්න ක්‍රමයක් තියෙනවා. චණ්ඩිකම්වලට බයේ යන්නේ නැහැ. ගෙවල් ඉදිරිපිට නරි වගේ කෑ ගැහුවට යන්න බැහැ. ඒවා අනුමත කරන්න බැහැ. පවතින දේශපාලන ගැටලු ඡන්දය තුලින් විසඳා ගනිමු. මට මගේ ගොවිතැන් කටයුතු කරගෙන යාමට පොහොර නොමැතිනම්, ව්‍යාපාර පවත්වාගෙන යාමට නොහැකිනම්, ආහාර පිස ගැනීමට ගෑස් නොමැතිනම් ආර්ථික අර්බුධය මටත් දැනෙනවා. ඒත් ආණ්ඩුවට ගෙදර යන්න දෙන්නේ නැහැ. රජය එහෙම යන්න ලෑස්තිත් නැහැ. ජනාධිපතිතුමාට ගෙදර යන්න කියන්නේ එතුමාට ඡන්දය දුන් හැටනම ලක්ෂය නෙොවෙයි. ඡන්දය ලබානොදුන් අයයි. රටට ආදරෙයි නම් රටේ ආර්ථිකය සංවර්ධනය කිරිම සඳහා පවතින වැඩ පිළිවෙල ඉදිරිපත් කරන්න. මාස කිහිපයකින් එම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරිමට උත්සාහ ගනිමු. අනතුරුව ඡන්දයකට යමු. රට අමාරුවෙන් සිටින කාලෙදි වැඩ කරන අයට මිනිස්සු පක්ෂ භේදයකින් තොරව ඡන්දය දෙනවා. පවතින ආර්ථික අර්බුදය දේශපාලන අර්බුධයක් කරගන්න එපා කියා මා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දක්වීම අනුව,
පින්නකන්ද මාර්ගය, අලුත්නුවර මාර්ගය, කරදියමුල්ල මාර්ගය යන මාර්ගවල මාර්ග සංවර්ධනය සඳහා ඉවුරු කපා දමා තිබුණත් වැඩ අවසන් කර නැහැ. ඒ නිසා ජනතාව අපහසුතාවයට පත්ව සිටින බව පිළි ගන්නවා. මේ පිළිබඳව විෂභාර අමාත්‍යවරයා දැනුවත් කල යුතුයි. මෙම මාර්ග සංවර්ධන කටයුතු ආරම්භ කර වසර හතරකට ආසන්නයි. එහෙත් සංවර්ධන කටයුතු අවසන් කර නැහැ. එහෙත් මේ පිළිබඳ දැනුම් දීමට වත්මන් තත්ත්වය තුල විෂය භාර අමාත්‍යවරයෙක් නැතත් විෂභාර අමාත්‍යවරයෙක් පත්කල වහාම ඒ බව දැනුම් දීමට පියවර ගන්නවා.

ආර්ථික අර්බුධය සමඟ මාර්ග සංවර්ධනය කලාම එම මාර්ග කන්නද කියා සමහරු ප්‍රශ්න කරනවා. කොළඹ ප්‍රදේශයේ අයට මාර්ග වල වටිනාකම නොදැනුනත් ගම්වාසීන් වන අපිටත්, ගමටත් මාර්ග වටිනවා. ගමේ ජීවත් වන ඔබලාට ද මාර්ගයක වටිනාකම දැනෙනවා ඇතැයි මා සිතනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා නැවත අදහස් දක්වමින්,
ගරු සභාපතිතුමනි අපි අපේ වෙළඳසැල සංවර්ධනය කර ගැනීමට ණය මුදලක් ලබාගන්නවා. එහෙත් එම ණය මුදල් වැයකර නිවසක් ඉදිකිරීම නිවැරදි ද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමියගේ, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමියගේ සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රී, අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමාගේ අදහස් දක්වීම අනුව,
උද්ගතව පවතින ආර්ථික පීඩනය පිළිබඳව රටේ කාන්තාවන්ට පමණක් නොවෙයි රටතුල වෙසෙන දෙකෝටි විසිලක්ෂකට ම දැනෙනවා. වතුකරයේ ජනතාවට පමණක් නොව සමස්ත ශ්‍රී ලාංකේය ජනතාවටම දැනෙනවා. එහෙත් මෙම ක්‍රමය වෙනස් කල යුතුයි. කවුරුන් හෝ මේ ආර්ථික ක්‍රමය විසඳීමට කටයුතු කල යුතුයි. එහෙත් පාරට බැහැලා තියෙන ආර්ථිකය විනාශ කරන එක නොවෙයි අපේ වගකීම වන්නේ. අපේ කොටස අපි නිවැරදිව කරමු. පාර්ලමේන්තු මන්ත්‍රී, අනුර කුමාර මැතිතුමාගේ වාහනයට නැංගේ කවුදැයි ඇසූ අවස්ථාවේ දී එතුමාට පිළිතුරු දීමට නොහැකිව අපහසුතාවයට පත් වුණා. එතුමා දුන් පිළිතුර අනුව මෙහි සංවිධානාත්මක කල්ලියක් සිටින බව පසක් වුණා. ඒ අනුව මෙහි පිටුපස සිටින්නේ කවුදැයි දැනගැනීමට හැකියාව පවතිනවා.
කැනඩා පාර්ලිමේන්තුව තුල අප රටේ ආර්ථිකය පිළිබඳව සාකච්ඡා කර තිබුණා. එහි දී එම සංවිධානය බලාපොරොත්තුවන ක්‍රියා කලාපයන් අනුව ශ්‍රී ලංකාවට උදව් කිරීමටත්, එහිදී ලංකා රජයේ හමුදාව සඳහා යොදවන මුදල් අවම කල යුතු බව ප්‍රකාශ කර තිබුණා. එමඟින් අපේ රටේ එල්.ටී.ටී.ඊ. සංවිධානය තුල පැවැති අදහස් අද බලාත්මක ව පවතින බව අපට හැඟෙනවා. ලංකාවට උදව් කරන්නේනම් කොන්දේසි ඉදිරිපත් කර ඊට අදාලව උපකාර කල යුතු බව ප්‍රකාශ කර තිබුණා. ප්‍රභාකරන්ගේ උත්සහය ක්‍රියාත්මක කරන්න උත්සාහ දරන බව පේනවා. අපිට කොතැනක ද සිට ද මේ කතා කරන්නේ කියා තේරෙනවා අපිට හැගෙනවා. ඩයස් පෝරාව වැනි සංවිධාන, සහ වෙනත් කල්ලි විසින් රජය හරහා නොවන ක්‍රම අනුගමනය කර උන්ඩියල් ක්‍රමයට මුදල් එවනවා. එම මුදල් රටේ අවශ්‍යතාවයට ගන්න බැහැ. රජයට ඩොලර් හිඟ වීමට එය එක් හේතුවක්. මෙය සංවිධානාත්මක ක්‍රියාවලියක්. අද බෙහෙත් පොහොර ගෑස් ගැනීමට ඉන්ධන ගැනීමට රජයට ඩොලර් නැහැ. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ රජයටත්, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස මටත්, මන්ත්‍රී මණ්ඩලයටත් ජනතාවගේ ප්‍රශ්න දැනෙනවා. ප්‍රදේශයේ මළ ගෙදරකට සහභාගී වුණාම මිනිස්සු මගෙන් ඒ පිළිබඳව විමසනවා. මේ රටට ආදරය කරන බුද්ධිමතුන් රටට විදේශ විනිමය ගෙන්වා ගැනීමේ දී සියලුම මුදල් මහ බැංකුව හරහා ගෙන්වා නොගන්නේ මන්දැයි මා දන්නේ නැහැ. එසේ වන්නේ නම් මීට වඩා රටේ ප්‍රශ්න විසදෙන බව මාගේ හැඟීමයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමා අදහස් දක්වීම අනුව,
ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය විසින් මෙරට සිදු වූ මිලේච්ඡ පාස්කු ප්‍රහාරයට පෙර පළාත් පාලන මැතිවරණය ජයග්‍රහනය කලා.

ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමාන්ලාගේ අදහස් දැක්වීම අනුව,
රටතුල පවතින වත්මන් ආර්ථික අර්බුධය පිළිබඳව ඔවුන් හොඳින් පැහැදිලි කලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
පඹහින්න ගලිවල කඩිනමින් සංවර්ධනය කිරිමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාර්මික නිලධාරි මහතා දැනුවත් කරනවා.

2015 වර්ෂයේ සිට මේ දක්වා ජාතික විදුලි බල පද්ධතියට එකම මෙගා වොට් එකක්වත් එකතු නොකිරීම විදුලි බලය නොමැති වීමට හේතුවක්. 2014 වර්ෂයේ දී වත්මන් අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමා සාම්පූර්වල තාපවිදුලි බලාගාරයක් ඉදි කිරිමට උත්සාහ ගත්තා. එහෙත් එම ප්‍රදේශය අවට ජනතාව පදිංචි වේයැයි සිතා ජ.වි.පෙ. ලාල්කාන්ත මැතිතුමා වැනි අය ඊට විරෝධතා පාමින් එම යෝජනාව කඩාකප්පල් කළා. එහෙත් එවැනිම විදුලි බලාගාරයක් වන කැළණිතිස්ස විදුලි බලාගාරය අසල ජනතාව ගැටලුවක් නොමැතිව පදිංචිව සිටිනවා. ඒ අනුව රටේ අවශ්‍ය අවස්ථාවන් වලදී සාධනීය කරුණු සඳහා සාධනීය උපදෙස් ලබා දිය යුතුයි. ඒ සඳහා සහයෝගය ලබා දිය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දක්වීම අනුව,
පිඩලිගන්නාවෙල මාර්ගය සංවර්ධනය කිරිම පිළබඳව කඩිනමින් දැනුවත් කිරිමට කටයුතු කරනවා.
සිරිමාවෝ බණ්ඩාරණායක මැතිණියගේ ආණ්ඩුව වසරකින් කඩාකලප්පල් වුණා. 1971 වර්ෂයේ ඊට විරෝධතා එල්ල වුණා. එතුමියගේ වැඩපිළිවෙල ක්‍රියාත්මක වුණානම් හොඳයි කියලා වසර 40 කට 50 කට පසුව අද ප්‍රකාශ කරනවා. එසේම අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව වසර 1 ½ කඩාකප්පල් කිරිම සඳහා විරෝධයක් එල්ල වෙලා. මෙය කඩාකප්පල් වූ දවසට ඔබට අපට දරුවන්ට යන්න වෙන තැනක් නැහැ. ඉතිරිවන්නේ මේ භූමිය පමණයි. අපේ රට ආරක්ෂා කිරීම ඔබේත් මගේත් වගකීම. ඒ සඳහා අපිට හැකි අයුරින් ඒ සඳහා කටයුතු කරමු.

## (09). මී ළඟ සභා වාරයට දින නියම කිරීම.

ඊළඟ සභා වාරය මැයි මස 10 වන අඟහරුවාදා පැවැත්වීමට දින නියම කරන ලදි.

## (10). ස්තූති කතාව හා අවසානය.

හත්වන සභාවේ පනස්වන සභාව සඳහා පැමිණි ගරු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ නිලධාරින් සියළු දෙනාටත්, මාධ්‍යවේදී මහතුන් සියළු දෙනාටත්, මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරමි. ලබන්නාවූ සිංහල හින්දු අලුත් අවුරුද්ද දුෂ්කරතා මැද වුවද සුභ නව වසරක් වේවායි ප්‍රාර්තනා කරනවා. එමෙන්ම සභාවට යෝජනා සහ අදහස් ප්‍රකාශ කල පසු එයට සාධනීය පිළිතුරු ලබා ගැනීම සඳහා සාකච්ඡාවට ගන්නා අවස්ථාවේ දී සභාව තුල රැඳී සිටින ලෙස දන්වා සිටිනවා.
ඉන් අනතුරුව, පෙ.ව. 12.25 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

එස්. ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත්,
සභාපති,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.